| 7 | 1882 | වන සංරක්‍ෂණ දෙපාර්තුමෙන්තුව | කොක්මෝට් වෙත තන්ත්‍රිමලේ පිවිසුම් සිට මාර්ගය නවීකරණය | 19.50 |
| 8 | 1896 | මහ නගරසභාව - යාපනය | ඔඩායි විදිය - සිවප්‍රකාසම් වීදිය සහ අතුරුමාර්ග ඇල සහ කාණු පද්ධතිය ෂෂ ප්‍රති ඉදි කිරිම. | 12.40 |
| 9 | 1897 | මහ නගර සභාව - යාපනය | ස්වාමි විදිය උප්පුකුලම් විදි අතුරුමාර්ග (3වන හරස් විදිය) ඇල මාර්ග කානු පද්ධතිය | 6.53 |
| 10 | 1898 | මහ නගරසභාව - යාපනය | හින්දු ලේඩිස් මාවත, අත්තිසූඩි විදිය කන්‍යාරාම මාවත සහ ඥානවෛරවර් ඉදිරිපස මාවත ඉදිකිරිම | 6.41 |
| 11 | 1906 | ප්‍රදේශිය සභාව - කන්තලේ | කන්තලේ ආධාහනාගාරය ඉදිකිරිම | 15.84 |
| 12 | 1908 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | කොන්ඩච්චි ජල සැපයුම් ව්‍යාපාරය | 25.56 |
| 13 | 1909 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | කුමන බාගුර | 31.77 |
| | | එකතුව | | 497.26 |

*සියලු අගයන් දක්වා ඇත්තේ වැට් බදු රහිතවය.*

# විශේෂ මෙහෙයුම් කාණ්ඩය

## කළමණාකාරිත්වයේ ප්‍රධාන සාමාජිකයන්

| | | |
|---|---|---|
| යූ. ආර්. හෙට්ටිආරච්චි මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි |
| පී. ජේ. පීටර් මහත්මිය | - | ඉංජිනේරු (සිවිල්) |
| එල්. ආර්. අභයරත්න මහතා | - | ඉංජිනේරු (සිවිල්) |
| ඩී. පී. එස්. සේනාධීර මහතා | - | ඉංජිනේරු (සිවිල්) |
| එම්. එම්. ප්‍රසන්න මහතා | - | ඉංජිනේරු (සිවිල්) |
| ටී. ඩී. කේ. චින්තක මහතා | - | ඉංජිනේරු (සිවිල්) |
| එල්. පී. පලිහක්කාර මහතා | - | ඉංජිනේරු (යාන්ත්‍රික) |
| එම්. එම්. එල්. ඩබ්ලිව්. බී. මනම්පේරි මහතා | - | වැඩ මුලික |
| පී. එම්. එස්. සමරතුංග මහතා | - | ප්‍රමාණ සමීක්ෂක |
| එම්. ඩී. ශ්‍රිවර්ධන මහතා | - | ප්‍රමාණ සමීක්ෂක |
| ඩබ්ලිව්. පී. වී. එන්. කුමාර මහතා | - | ප්‍රමාණ සමීක්ෂක |
| ආර්. එන්. එන්. විජේරත්න මහතා | - | ප්‍රමාණ සමීක්ෂක |
| එච්. ඩී. ඩී. පී. කොඩිතුවක්කු මහතා | - | ප්‍රමාණ සමීක්ෂක |
| සී. අයි. පී. විජේරත්න මහත්මිය | - | සිවිල් අධිකාරි |
| පී. ආර්. සී. කුලතුංග මහතා | - | සැලසුම්කරු |
| ඩී. එස්. නෙලුම්දෙනිය මහත්මිය | - | සැලසුම්කරු |
| එම්. ඩී. ඩී. දයාරත්න මහත්මිය | - | ගණකාධිකාරි |





# ප්‍රගති සමාලෝචනය

විශේෂ මෙහෙයුම් කණ්ඩායම 2011 වර්ෂයේ මැද භාගයේ ආරම්භ කරන ලද්දේ විශේෂයෙන් ප්‍රාදේශිය මාර්ග පද්ධති කාපට් කිරීම් කටයුතු ප්‍රධාන දිස්ත්‍රික්ක තුනක එනම් රත්නපුර, ගාල්ල සහ මාතලේ ආරම්භ කිරීම සඳහාය. සේවාදායක ආර්ථීක හා සංවර්ධන අමාත්‍යංශය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ප්‍රාදේශිය මාර්ග ව්‍යාපෘති 180 ක් පවරන ලද අතර එම කාර්ය විශේෂ මෙහෙයුම් කාණ්ඩය විසින් මෙහෙයවනු ලබයි. කොන්ත්‍රාත් අගය රු. මි. 13,395.75 කි.

2012 වර්ෂයේ මෙම කාණ්ඩයේ මුළු පිරිවැටුම රු. මි. 3,106 ක් වු අතර එය 2011 වසරේ පිරිවැටුම වු රු. මි. 622 ට සාපේක්ෂිතව සැලකිය යුතු වැඩිවීමකි. මෙම කාණ්ඩයේ දල මෙහෙයුම් ලාභය වන රු. මි. 399.6 අපේක්ෂිත ඉලක්කය වු රු. මි. 200 හා සංසන්දනය කිරීමේදී රු. මි. 199 ක වැඩිවීමකි. 2012 වර්ෂය අවසාන වනවිට කාණ්ඩය මර්ග 82 ක කි. මී. 420 ක කාර්පට් අතුරා අවසන් කර තිබුණි.

මෙයට අමතරව මෙම කාණ්ඩයට ගල්තාර, ක්‍රෂර් යන්ත්‍ර, ගල්තාර අතුරන උපකරණ, බැකෝ හා පටවන යන්ත්‍ර, වීල් ලෝඩර්ස්, මෝටර් ග්‍රේඩර්ස්, පාර තලන රෝල, ඇන්ගල් බ්‍රෘම්ස් ආදී යන්ත්‍ර උපකරණ 101 ලැබී තිබුණි. ගල්තාර හා ක්‍රෂර් යන්ත්‍ර ගල්පාත ස්ථිර වැඩබිම් තුල සවිකර ඇත. පර්යේෂණ මෙහෙයුම් සාර්ථක බැවින් 2013 වර්ෂයේ සිට නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිතය. මෙම යන්ත්‍රයෙන් නිෂ්පාදනය කරන ගල්තාර ප්‍රදේශිය මාර්ග කාපට් කිරීම් ව්‍යාපෘති සඳහා උපයෝගි කරගනු ඇත.





## 2012 වර්ෂයේ ක්‍රියාත්මක (ප්‍රධානය කල සහ ප්‍රධානය නොකල) ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | ඡන්දකොට්ඨාශය | ව්‍යාපෘති අංක | නිවැරදි දිග (කිමි) | කොන්ත්‍රාත් අගය (රු. මි) |
|---|---|---|---|---|
| ගාල්ල පලාත මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘති | හිනිදුම | 4 | 27.75 | 522.12 |
| | කරන්දෙනිය | 7 | 32.41 | 465.56 |
| | අම්බලන්ගොඩ | 8 | 42.90 | 758.56 |
| | හබරාදූව | 12 | 37.36 | 677.94 |
| | බලපිටිය | 8 | 31.56 | 776.78 |
| | බද්දේගම | 7 | 44.36 | 126.91 |
| | රත්ගම | 18 | 40.30 | 770.86 |
| | ගාල්ල | 18 | 23.02 | 447.34 |
| | අක්මීමන | 13 | 37.83 | 663.55 |
| | ඇල්පිටිය | 8 | 29.00 | 724.31 |
| | එකතුව | 103 | 346.49 | 5,933.93 |
| රත්නපුර පලාත මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘති | රත්නපුර | 5 | 27.35 | 483.70 |
| | ඇහැලියගොඩ | 11 | 48.59 | 1,229.94 |
| | නිවිතිගල | 4 | 28.25 | 572.55 |
| | කලවාන | 7 | 24.57 | 531.44 |
| | කොලොන්න | 8 | 26.72 | 712.89 |
| | රක්වාන | 5 | 31.22 | 564.43 |
| | පැල්මඩුල්ල | 7 | 34.58 | 803.90 |
| | බලන්ගොඩ | 5 | 15.27 | 360.50 |
| | එකතුව | 52 | 236.54 | 5,259.35 |
| මාතලේ පලාත මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘත | මාතලේ | 7 | 36.81 | 601.84 |
| | දඹුල්ල | 4 | 29.10 | 494.33 |
| | ලග්ගල | 5 | 27.78 | 532.14 |
| | රත්තොට | 9 | 33.52 | 574.16 |
| | එකතුව | 25 | 127.20 | 2,202.47 |
| | එකතුව | 180 | 710.23 | 13,395.75 |

## ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය

| අයිතමය | දිස්ත්‍රික්කයේ නම | මුළු දිග (කි. මි.) | නිමකරන ලද දිග (කි. මි.) | කාපට් යොදා නිමකල ව්‍යාපෘති (ගනන) | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | ගාල්ල | 350.13 | 209.67 | 60 | 73% |
| 2 | රතනපුර | 236.54 | 144.3 | 17 | 69% |
| 3 | මාතලේ | 127.20 | 65.35 | 5 | 62% |
| | එකතුව | 713.87 | 419.32 | 82 | 68% |

Notes

# මානව සම්පත් හා පරිපාලන කාණ්ඩය

## කළමණාකාරිත්වයේ ප්‍රධාන සාමාජිකයන්

එස්. පි. ලොකුනන්නන්දිගේ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මාස හා ප)

ඊ. ඒ. ආර්. එදිරිසිංහ මහතා - කළමණාකරු - සංවර්ධන හා පුහුණුකිරීම

ඕ. ඩී. පී. එස්. ජයවීර මහත්මිය - නීති නිලධාරි

එච්. බි. ආර්. එස්. එස්. බස්නායක මහත්මිය - සහකාර නීති නිලධාරි

කේ. එල්. එම්. සමරතුංග - සහකාර පිරිස් කළමණාකාර

මේජර් ඩී. එන්. ආර්. පිරිස් - ප්‍රධාන ආරක්ෂක නිලධාරි

ගාමිණි මාකොලගේ - පරිපාලන නිලධාරි

තුෂාර ගුණසේකර මහතා - පරිපාලන නිලධාරි

තරුක්ෂි ලියනගේ මෙනවිය - පරිපාලන නිලධාරි

අයි. ඩී. දයානන්ද මහතා - ප්‍රවාහන නිලධාරි

නිමල් මෙන්ඩිස් මහතා - මහජන සම්බන්ධතා නිලධාරි

1. 2012 වර්ෂයේ ආයතනය කාර්‍යය මණ්ඩලය 3022 වු අතර එයින් 2090 ස්ථිර සේවකයන් 911 කොන්ත්‍රාත් පදනම මත සහ 21 ක් අනියම් සේවයකයන් විය.
2. ජාතික උපකරණ හා යන්ත්‍ර ආයතනය, රා. ඉ. සං. හා ඒකාබද්ධ විමෙන් අනතුරුව ස්ථිර කාර්යය මණ්ඩලය 490කින් ඉහල නැංවීම.
3. පහත සටහන පෙර වසර හා සංසන්දනය කිරිමේදී සංස්ථා කාර්‍ය මණ්ඩලය බේදි ඇති ආකාරය පෙන්නුම් කරයි. මෙහි අනියම් සේවකයන් පිළිබඳව සඳහන් නොවේ.

| | Description | 2012 | | 2011 | | 2010 | |
|---|---|---|---|---|---|---|---|
| | | Permanent | Contract | Permanent | Contract | Permanent | Contract |
| 1 | සභාපති / උප සභාපති | - | 2 | - | 2 | - | 2 |
| 2 | ක්‍රියාකාරි අධ්‍යක්ෂක | - | 1 | - | 1 | - | 1 |
| 3 | සාමාන්‍යාධිකාරි | - | 1 | 1 | - | 1 | - |
| 4 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම්) | 1 | - | 1 | - | 1 | - |
| 5 | නි. සා. (ඉදිකිරීම් උපාංග) | 1 | - | 1 | - | 1 | - |
| 6 | නි. සා. (කාර්මික හා විදුලි) | - | 1 | - | 1 | - | 1 |
| 7 | නි. සා. (උපදේශන) | - | - | 1 | - | 1 | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 8 | නි. සා. අ. (මා. ස. හා පරිපාලන) | - | 1 | - | 1 | - | 1 |
| 9 | නි. සා. අ. (මූල්‍ය) | - | 1 | 1 | - | 1 | - |
| 10 | නි. සා. අ. (විශේෂ මෙහෙයුම් ඒකකය) | - | 1 | - | 1 | - | - |
| | නි. සා. අ. (යන්ත්‍ර) | 1 | - | - | - | - | - |
| 11 | ජ්‍යෙෂ්ඨ උපදේශක (පර්යේෂණ හා සංවර්ධන) | - | - | 1 | - | - | - |
| 12 | කළමණාකරු (ඉදිකිරීම්) | 1 | - | 1 | - | 1 | - |
| 13 | ප්‍රධාන ඉංජිනේරු (සැලසුම්) | 1 | - | 1 | - | 1 | - |
| 14 | ප්‍රධාන ඉංජිනේරු (විදුලි) | - | - | - | 1 | - | 1 |
| 15 | ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) | 1 | - | - | 1 | - | 1 |
| 16 | ප්‍රධාන තක්සේරුකරු | - | - | - | - | - | - |
| 17 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (වායු සමීකරණ) | - | 1 | - | 1 | - | - |
| 18 | ඉංජිනේරු (තොරතුරු තාක්‍ෂණ) | - | - | - | - | - | 1 |
| 19 | ඉංජිනේරු (සිවිල්, යාන්ත්‍රික, විදුලි) | 75 | 78 | 76 | 59 | 48 | 97 |
| 20 | ගෘහ නිර්මාණ ශිල්පි | 19 | 13 | 21 | 10 | 13 | 15 |
| 21 | ප්‍රධාන ප්‍රමාණ සමීක්ෂණ | 09 | 20 | 11 | 16 | 04 | 25 |
| 22 | ගණකාධිකාරි | 06 | 05 | 03 | 05 | 03 | 05 |
| 23 | පරිපාලන නිලධාරි | 22 | 03 | 03 | 03 | 03 | 02 |
| 24 | වෙනත් විධායක නිලධාරින් | 29 | 74 | 20 | 24 | 37 | 15 |
| 25 | ජ්‍යෙෂ්ඨ අධිකාරි සිවිල්, යාන්ත්‍රික, විදුලි | 24 | - | 21 | - | - | - |
| 26 | අධිකාරි සිවිල්, යාන්ත්‍රික, විදුල | 37 | 141 | 26 | 141 | 27 | 123 |
| 27 | නිර්මාණකරු / සහකාර ප්‍රධාන ප්‍රමාණ සමීක්ෂක | 48 | 108 | 50 | 64 | 42 | 34 |
| 28 | වැඩමුලික | 45 | 42 | 37 | 31 | 25 | 31 |
| 29 | ලිපිකරු හා සමානත්ර ශ්‍රේණි | 248 | 157 | 194 | 183 | 175 | 142 |
| 30 | අරක්‍ෂක සේවකයින් | 142 | 23 | 109 | 25 | 116 | 12 |
| 31 | අර්ධ පුහුණු සේවක | 90 | 28 | 76 | 11 | 52 | 07 |
| 32 | පුහුණු සේවක | 666 | 69 | 459 | 62 | 419 | 42 |
| 33 | නුපුහුණු සේවක | 624 | 141 | 580 | 81 | 687 | 53 |
| 34 | අතුරු එකතුව | 2090 | 911 | 1694 | 724 | 1659 | 610 |
| | මුළු එකතුව | 3001 | | 2418 | | 2269 | |

4. වෙන්කිරීම් අනුමත වීමෙන් පසුව 2012 වර්ෂය සඳහා සේවක මණ්ඩලය පහත ආකාරයට විය.

I. 2009.11.25 දක්වා අනුමත සේවක සංඛ්‍යාව - 1961
II. 2011.02.14 දක්වා අනුමත සේවක සංඛ්‍යාව - 107
III. 2011.12.23 දක්වා අනුමත සේවක සංඛ්‍යාව - 181
IV. 2012.06.22 දක්වා අනුමත සේවක සංඛ්‍යාව - 02
V. 2012.10.25 දක්වා අනුමත සේවක සංඛ්‍යාව - 260
2539

5. ජාතික උපකරණ හා යන්ත්‍ර ආයතනයේ සේවයකයන් 490 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට බඳවා ගන්නා ලදි. (අනුමත කාර්ය මණ්ඩලය 344 ක් වු අතර ඉතිරි සංඛ්‍යාව පොරොන්දු පදනම මත විය.

6. 2012 වසරට අදාල සියළු අභ්‍යන්තර උසස්වීම් සම්පුර්ණ කර ඇත.

I. ඉංජිනේරු (සිවිල්) - 25
II ගෘහ නිර්මාණ ශිල්පින් - 03
III ප්‍රමාණ සමීක්‍ෂක - 01
IV නෛතික නිලධාරි - 01
V ගණකාධිකාරී - 03
VI සහකාර ප්‍රමාණ සමීක්‍ෂණ / කළමණාකරන සහකාර/ KKS/ ආරක්‍ෂක නියාමක තනතුරු සඳහා අභ්‍යන්තර විභාග පැවැත්වුවද උසස්වීම් මෙතෙක් ලබා දී නැත.

7. ඉංජිනේරුවන්, ගෘහ නිර්මාණ ශිල්පින්, ප්‍රමාණ තක්සේරුකරුවන් සඳහා රු. 15,000/- ක තාක්‍ෂණ දීමනාවක්ද, සිවිල්, යාන්ත්‍රික, විදුලි අධිකාරින් සඳහා රු. 5000/- ක තාක්‍ෂණ දීමනාවක්ද ලබාදෙන ලදි.

8. තාක්‍ෂණ දීමනාව ලබා නොදුන් ස්ථිර සේවකයන්ට රු. 4000/- ක විශේෂ දීමනාවක්ද, කොන්ත්‍රාත් පදනමේ සේවකයන්ට රු. 2000/- දීමනාවක්ද දෙන ලදි.

9. සියලුම සේවකයන්ට රු. 5000/- ක විශේෂ අළුත් අවුරුදු දීමනාවක ලබාදෙන ලදි.

10. සියලුම සේවකයන්ට රු. 10,000/- වාර්ෂික ප්‍රසාද දීමනාවක්ද දෙන ලදි.

11. සේවකයින් 25 දෙනෙකුට රු. 100,000/- අපදානය මුදල් දෙන ලදි.

12. රාජ්‍ය ව්‍යවසාය චක්‍ර ලේඛණයට අනුව වයස 57 සම්පූර්ණ වූ සේවකයන් සේවය ඉවුකිරීම සැලකිල්ලට ගෙන වයස අවුරුදු 60 දක්වා සේවය අළුත් කරන ලදි.

13. විවිධ අංශ නියෝජනය කරන පුහුණු සේවකයන් සඳහා ජාතික වෘතීය සුදුසුකම් සහතිකය ලබාගැනිම සඳහා NAITA-1 CTAD සහයෝගය ඇතිව කටයුතු සැලසීම.

14. සුදුසුකම් නොමැති අය විභාග වලට පෙනී සිට සාර්ථක ප්‍රතිඵල ලබාගැනීමෙන් පසුව තනතුරු ලබාදීම.

15. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (NEMO) සංවිධානය රා. ඉ. සං හා ඒකාබද්ධ වීමෙන් අනතුරු NEMO සේවකයන්ගේ වේතන රා. ඉ. සං. වේතන මට්ටම් හා ගැලපෙන ලෙසට රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛන අංක 30 ට අනුකූලව සකස් කරන ලදී.

16. NEMO එකාබද්ධ වීමෙන් අනතුරුව එහි සේවකයන් සියලුදෙනා රා. ඉ. සං. නාම ලේඛනයට ඇතුලත් කරගන්නා බවට පත්වීම් ලිපි ලබා දෙන ලදී.

17. ඇතුලත් කරගැනිමේ ක්‍රියාවලිය තුලදී විවිධ වාදබේද ඇතිවූ අතර එම ඉල්ලීම් ගැන සලකා බැලිම සඳහා ස්වාධීන මණ්ඩලයක් පත්කර එම නිරීක්ෂණ පදනම්ව වර්ථාවක් සකස් කරන ලදි.

18. උපකරණ හා යන්ත්‍ර කාණ්ඩයේ සාර්ථක අපේක්ෂකයන් හට උසස්වීම ලබාදෙන ලදි.

19. තාක්ෂණ කාණ්ඩයේ (ඉංජිනේරු, ගෘහ නිර්මාණ හා ප්‍රමාණ සමීක්ෂණ) ස්ථිර කිරිම පිළිබඳ මණ්ඩල අනුමැතිය සහිතව තනතුරු ලබාදෙන ලදි.

20. සේවයේ යොදවා සිටි තනතුරු ලබා දී නොතිබුණ නුපුහුණු සේවකයන් හට තනතුරු ලබාදෙන ලදි.

21. සිවිල් යාන්ත්‍රික හා විදුලි අධිකාරින්වරුන් තනතුරේ ස්ථිර කිරිම සඳහා සම්මුඛ පරීක්ෂණ කැඳවන ලදි.

22. ප්‍රධාන ආරක්ෂක නිලධාරි සහ ගණකාධිකාරි ස්ථිර තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ කැඳවන ලදි.

23. නීති අංශය
i. නඩු අංක R.E/197 බණ්ඩාරවෙල දිස්ත්‍රික් උසාවිය
ii. නඩු අංක 533/2009 අම්පාර කම්කරු උසාවිය
iii. නඩු අංක 57914/M.R. කොළඹ දිස්ත්‍රික් උසාවිය

මෙම නඩු පිළිබඳ තීන්දු රා. ඉ. සං. ට වාසි වන අන්දමට ලබා දී ඇත.

24. 2012 වර්ෂය තුලදී පුහුණු වැඩ සටහන් 66 ක් මඟින් සේවකයන් 385 දෙනෙකු හට පුහුණුව ලබාදෙන ලදි.

25. රාජ්‍ය ආයතනවල පුහුණුව ලබමින් සිටි 188 දෙනෙකු 2012 වර්ෂයේ බඳවා ගන්නා ලදි.

26. රා. ඉ. සං. සම්පූර්ණ සේවක සංඛ්‍යාව 2012 දෙසැම්බර් 31 වන විට පහත සඳහන් ආකාරයට විය.

| | | |
|---|---|---|
| i. | ස්ථිර | - 2090 |
| ii. | කොන්ත්‍රාත් පදනම මත | - 911 |
| iii. | අනියම් | - 21 |
| | එකතුව | -3022 |

27. මානව සම්පත් සහ පරිපාලන අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් ආකාරයට විය.
ඒ අනුව 2012 වර්ෂයේදී මානව සම්පත් සහ පරිපාලන අංශයේ සේවකයින් 63 ක් සේවයේ නිරත විය.

Notes

# අභ්‍යන්තර විගණන අංශය

**කළමණාකාරිත්වයේ ප්‍රධාන සාමාජිකයන්**

M .H. සේනාවිර - ප්‍රධාන අභ්‍යන්තර විගණක නිළධාරී

**අභ්‍යන්තර විගණක වාර්තාව**

සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන සැලසුම විගණකාධිපතිවරයා වෙත සම්මුතිය සඳහා ඉදිරිපත් කර අනුමත වී ඇත.

2012 වර්ෂය තුල, ප්‍රධාන අභ්‍යන්තර විගණක නිළධාරී විසින් කළමණාකාරිත්වය වෙත විගණන වාර්තා 68 ක් ඉදිරිපත් කර ඇත. මෙම වාර්තා වල සම්පිණ්ඩිත පිටපත් එක් කාර්තුවකට වරක් විගණන හා කළමණාකරන කමිටුව සහ අධ්‍යක්‍ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

2012 වර්ෂය තුලදී විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් වාර 03 ක් පවත්වා ඇත. එමෙන්ම, අභ්‍යන්තර විගණන වාර්තාවල සම්පිණ්ඩිත පිටපත් ද විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

**පූර්ව - විගණක පරීක්‍ෂණය**

සේවකයින් 210 දෙනෙකුට ගෙවිය යුතු අවසාන ගෙවීම්, සේවකයින් 45 දෙනෙකුට ගෙවිය යුතු පාරිතෝෂික මුදල්, සේවකයින් 207 දෙනෙකු සම්බන්ධව අයිතිවාසිකම් නොඉල්ලූ සහතික, උප කොන්ත්‍රාත්කරුවන් 263 දෙනෙකුට හිමි අවසාන ගෙවීම් මුදා හැරීම ආදිය පිලිබඳව පූර්ව විගණක පරීක්‍ෂණ පවත්වා ඇත.

සමාලෝචිත වර්ෂය තුලදී අභ්‍යන්තර විගණක නිළධාරීන් ලංසු විවෘත කිරීමේ අවස්ථා 149 කටද අබලි ද්‍රව්‍ය නිෂ්කාශණ කටයුතු අවස්ථා 15 කටද සහභාගී වූහ.

# මූල්‍ය කාණ්ඩය

## කළමණාකාරීත්වයේ ප්‍රධාන සාමාජිකයන්

| | | |
|---|---|---|
| එම්. කේ. ජයන්ත මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) |
| පි. එම්. ඒ. කරුණාසිංහ මහතා | - | වැඩබලන කළමණාකාර (මූල්‍ය) |
| බී. එල්. කේ. දයානී මහත්මිය | - | ගණකාධිකාරී (ගෙවීම්) |
| ටි. එස්. අප්සරා රොහාන් මෙනවිය | - | ගණකාධිකාරී (මූල්‍ය ගිනුම්) |
| ඒ. නිලූපා ඩිල්සාරා මෙනවිය | - | ගණකාධිකාරී (වැටුප් හා වේතන) |
| කේ. ඩබ්ලිව්. එම්. එල්. ඩි. කීර්තිරත්න මෙනවිය | - | ගණකාධිකාරී (ඉදිකිරීම්) |
| එච්. කේ. බන්දුල යෝදීශ්වර මහතා | - | ගණකාධිකාරී (ඉදිකිරීම්) |
| එස්. ඒ. එම්. ඒ. බි. ජේ. කේ. සේනාරත්න මෙනවිය | - | ගණකාධිකාරී(යාන්ත්‍රික හා විදුලි) |
| කේ. බි. පී. එච්. එන්. කාරියවසම් මහතා | - | ගණකාධිකාරී (ඉදිකිරීම් උපාංග) |
| එම්. එම්. අනෝරත්න මහතා | - | ගණකාධිකාරී (උපදේශන) |
| ඩිනේෂ දයාරත්න මෙනවිය | - | ගණකාධිකාරී (විශේෂ මෙහෙයුම්) |
| මානෙල් ද සිල්වා මෙනවිය | - | ගණකාධිකාරී (යන්ත්‍රෝපකරණ) |
| ඒ. එල්. සමන්ති පෙරේරා මෙනවිය | - | ගණකාධිකාරී (යන්ත්‍රෝපකරණ) |

## ප්‍රගති සමාලෝචනය

මූලික ප්‍රාග්ධනය රු. මිලියන 1.0 ක් සහ රු. 400,000/- ක දායකත්වයක් සහිතව 1962 වර්ෂයේ ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පිහිට වූ බව 31.03.1963 දින විගණක වාර්ථාවේ සඳහන් වේ. තවදුරටත් දායකත්වය දක්වමින් රජය විසින් වාරික පහකින් 1966 වර්ෂයේ රු. 2,769,850, 1968 වර්ෂයේ රු. 14,900,150, 1969 වර්ෂයේ රු. 9,835,000, 1971 වර්ෂයේ රු. 2,005,000 සහ 1974 වර්ෂයේ රු. 40,000,000 ක් වශයෙන් රු. මි. 70.0 ක් වශයෙන් ලබාදී වසර 12 ක් තුල පවත්වාගෙන ඇත. වසර 50 ක් සමරන 2012 වර්ෂයේ ඇල්ම ඇති පාර්ශවයන්ගේ අවම දායකත්වය ලබමින් රා. ඉ. ස. විවිධ බාධක මැදින් ඉදිරියටම යන ශ්‍රී ලංකා රජය සතු ස්වාධීන ව්‍යාපාරයකි. ක්‍රියාකාරකම් තුලින් රු. මි. 991.0 ක්ද වෙළඳපොල අගය රු. මි. 7.9 ක් වන ජංගම නොවන වත්කම් ද ජංගම වත්කම් රු. බි. 9.8 කටද හිමිකම් ඇත.

# මූල්‍ය වාර්තාව

- ශේෂ පත්‍රය
- ආදායම් ප්‍රකාශන
- හිමිකම් වෙනස්කම් ප්‍රකාශය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- මූල්‍ය ප්‍රකාශ හා ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සටහන්

## ශේෂ පත්‍රය

| | සටහන් | 2012 රු. | 2011 රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල යන්ත්‍ර හා උපකරණ | 2 | 7,920,043,178 | 250,571,616 |
| කොටස්වල ආයෝජනය HDFC හී කොටස් 12,000 එකක් රු. 100.00 බැගින්) | 3 | 607,200 | 16,800,000 |
| නොනිමි ප්‍රාග්ධන අයිතම | | 48,647,500 | 7,891,609 |
| | | **7,969,297,878** | 275,263,225 |
| විලම්භීත බදු | | **35,158,534** | 37,026,852 |
| ජංගම වත්කම් | | | |
| තොගය | 04 | 532,802,115 | 600,946,877 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 05 | 6,082,029,258 | 4,689,700,775 |
| වෙනත් ජංගම වත්කම් | 06 | 3,026,130,069 | 2,126,282,571 |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 07 | 11,823,325 | 14,635,600 |
| මුදල් හා මුදල් සමාන | 08 | 212,231,584 | 271,650,960 |
| | | **9,865,016,351** | 7,703,216,783 |
| වත්කම් එකතුව | | **17,869,472,764** | 8,015,506,859 |
| හිමිකම් හා බැරකම් | | | |
| ප්‍රාග්ධනය හා වෙන්කිරීම් සංචිත | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 70,000,000 | 70,000,000 |
| ප්‍රාග්ධන උපචයන සංචිත | | 27,738,806 | 27,738,806 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 7,728,678,484 | - |
| පොදු සංචිත | | 3,602,690 | 3,635,162 |
| යාන්ත්‍රික හා විදුලි ප්‍රාග්ධනය | | (167,291,865) | (152,287,728) |
| අලෙවිය සඳහා ඇති සංචිත | | (592,800) | 15,600,000 |
| සමුච්චිත වූ ලාභ / (පාඩු) | | 991,008,588 | 825,496,824 |
| මුළු හිමිකම් අයිතිය | | **8,653,143,903** | 790,183,064 |

| | | | |
|---|---|---|---|
| **ජංගම නොවන බැරකම්** | | | |
| දිගුකාලීන බැරකම් | | 30,800,000 | 30,800,000 |
| පොලි දරණ බැරකම් | 09 | **2,643,857** | 9,472,634 |
| විශ්‍රාම අර්ථලාභ වගකීම් | 10 | **205,299,150** | 156,905,063 |
| | | **238,743,007** | 197,177,697 |
| **ජංගම බැරකම්** | | | |
| භාණ්ඩාගාර ණය පොලිය | | | |
| වෙළඳ ගෙවිය යුතු | 11 | 4,861,093,314 | 4,228,067,273 |
| පොලි සහිත බැරකම් | 09 | 6,692,189 | 5,614,023 |
| වෙනත් ජංගම බැරකම් | 12 | 3,514,497,225 | 2,656,549,014 |
| බැංකු අයිරා | 13 | 595,303,126 | 137,915,787 |
| | | 8,977,585,854 | 7,028,146,097 |
| **මුළු හිමිකම් සහ වගකිම් 2012** | | **17,869,472,763** | 8,015,506,859 |

මෙහි දැක්වෙන අධ්‍යක්ෂක මණ්ඩලයේ සහතිකය රාජ්‍ය ව්‍යවසාය චක්‍ර ලේඛන අංක 45 හී අනුදේශයන්ට අනුකූල අධ්‍යක්ෂක සහතිකය, පිටු අංක 02, 03 හි ගිණුම්කරන ප්‍රකාශන, පිටු අංක 05 සිට 14 දක්වා ඇති සටහන් ද මෙම මුල්‍ය ප්‍රකාශනයේම සමස්ත කොටසක් වේ. මෙම මුල්‍ය ප්‍රකාශන සැකසිම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය වගකිවයුතු වන අතර, අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත ඔවුන් වෙනුවෙන් අත්සන් තබමි.

**සභාපති**

B. K. JAGATH KUMARA PERERA
CHAIRMAN / CEO
STATE ENGINEERING CORPORATION OF SRI LANKA

**අධ්‍යක්ෂක**

01/03/13
DIRECTOR
STATE ENGINEERING CORPORATION OF SRI LANK

## දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා සවිස්තර ආදායම් ප්‍රකාශය

| | | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|---|
| ආදායම | **17** | **7,951,205,894** | **5,473,848,679** |
| අලෙවි පිරිවැය | | 7,297,286,157 | 4,946,759,636 |
| දළ ලාභය | **18** | **653,919,737** | **527,089,043** |
| වෙනත් මෙහෙයුම් ආදායම් හා වාසි | 19 | 25,910,734 | 22,187,333 |
| පරිපාලන වියදම් | 20 | (439,624,663) | (213,931,054) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ප්‍රතිපල | | **240,205,808** | **335,345,322** |
| මූල්‍ය වියදම් | 21 | (17,712,733) | (9,763,078) |
| මූල්‍ය ආදායම් | 22 | 3,415,480 | 22,194,710 |
| දළ මූල්‍ය වියදම් | | **(14,297,253)** | **12,431,632** |
| බදු ගෙවීමට පෙර දළ ලාභ / පාඩු) | | **225,908,555** | **347,776,954** |
| ආදායම් බදු වියදම් | | 19,918,670 | 46,822,600 |
| විලම්භීත බදු | | 1,868,318 | (35,080,670) |
| **බදු ගෙවීමෙන් පසු දළ ලාභ/පාඩු)** | | **204,121,567** | **336,035,024** |
| වෙනත් සවිස්තර ආදායම් | | | |
| | | (16,192,800) | 10,200,000 |
| වත්කම් යන්ත්‍ර හා උපකරණ පිලි අගැයුමෙන් පසු අතිරික්කය | | 7,728,678,484 | - |
| **වර්ෂය සඳහා සවිස්තර ආදායම් එකතුව** | | **7,916,607,251** | **346,235,024** |

පිටු අංක 06 සිට 27 දක්වා ඇති ගනනය ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයේම සංස්ථනිය කොටසක් වේ.

# හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය

| | අනුදත් ප්‍රාග්ධනය රු. | ප්‍රාග්ධන වර්ධන සංචිත රු. | ප්‍රත්‍යාගණන සංචිත රු. | පොදු සංචිත රු. | යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනය රු. | අලෙවිය සඳහා වූ දෑ සඳහා සංචිත රු. | රැඳවූ ඉපයීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 210-12-31 දිනට ශේෂය | 70,000,000 | 27,738,806 | - | 3,635,162 | - | - | 488,543,167 | 589,917,135 |
| පෙර වර්ෂයේ නිවැරදි කිරීම් | - | - | - | - | - | - | (1,027,549) | (1,027,549) |
| 2011-01-01 දිනට ශේෂය (නැවත සටහන් කිරීම) | **70,000,000** | **27,738,806** | **-** | **3,635,162** | **-** | **-** | **487,515,618** | **588,889,586** |
| විලම්භිත බදු යෙදවුම් | - | - | - | - | - | - | 1.946,182 | 1,946,182 |
| ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශන වාර්ථා කිරීමේ ප්‍රමිතිය මුල්වරට යෙදීම නිසා වන ගැලපීම් | - | - | - | - | - | 5,400,000 | - | 5,400,000 |
| 2011-01-01 දිනට ශේෂය (නැවත සටහන් කිරීම) | **70,000,000** | **27,738,806** | **-** | **3,635,162** | **-** | **5,400,000** | **489,461,800** | **596,235,768** |
| අන්තර්ග්‍රහණයන් වූ ශුද්ධ බලපෑම | - | - | - | - | (152,287,728) | - | - | (152,287,728) |
| මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම් මත ගිණුම් කිරීමේ ශුද්ධ වෙනස | - | - | - | - | - | 10,200,000 | - | 10,200,000 |
| කාල පරිච්චේදය සඳහා වූ ලාභය | - | - | - | - | - | - | 336,035,024 | 336,035,024 |
| 2011-12-30 දිනට ශේෂය | **70,000,000** | **27,738,806** | **-** | **3,635,162** | **(152,287,728)** | **15,600,000** | **825,496,824** | **790,183,064** |
| 2012-01-01 දිනට ශේෂය | **70,000,000** | **27,738,806** | **-** | **3,635,162** | **(152,287,728)** | **15,600,000** | **825,496,824** | **790,183,064** |
| පිරිවැය හඳුනාගත් භාන්ඩාගාර ප්‍රධාන නියමිත කාලයට මාරු කිරීම | - | - | - | - | (15,004,137) | - | - | (15,004,137) |
| තොග අධිගණනය මත වූ ගැලපුම් | - | - | - | - | - | - | (38,609,803) | (38,609,803) |
| පූර්ව වර්ෂ ගැලපීම් වල වූ බලපෑම | - | - | - | - | - | - | - | - |
| යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ අරමුදල | - | - | - | (32,472) | - | - | - | (32,472) |
| කාල පරිච්චේදයේ විස්තිරණ ආදායම් | - | - | - | - | - | - | - | - |
| කාල පරිච්චේදයේ ලාභය | - | - | - | - | - | - | 204,121,567 | 204,121,567 |
| කාල පරිච්චේදයේ අනෙකුත් විස්තිරණ ආදායම් | - | - | - | - | - | - | - | - |
| මූල්‍ය වත්කම්හි සාධාරණ වටිනාකමේ ශුද්ධ වෙනස | - | - | - | - | - | (16,192,800) | - | (16,192,800) |
| දේපල යන්ත්‍රෝපකරණ හා ප්‍රත්‍යාගණනය | - | - | 7,728,678,484 | - | - | - | - | 7,728,678,484 |
| 2012-12-31 දිනට ශේෂය | **70,000,000** | **27,738,806** | **7,728,678,484** | **3,602,690** | **(167,291,865)** | **(592,800)** | **991,008,588** | **8,653,143,903** |

## 31.12.2012 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| අයිතම විස්තරය | 2012 | 2011 |
|---|---|---|
| වර්ෂය සඳහා විස්තීරණ ආදායමේ එකතුව | 7,916,607,251 | |
| ප්‍රත්‍යාගණන සහ සාධාරණ අගය ගැලපුම | (7,712,485,684) | |
| බදු අඩුකිරීමෙන් පසු දල ලාභය | 204,121,567 | |
| එකතු ඃ විලම්භිත බදු සහ ආදායම් බදු වියදම් | 21,786,988 | |
| බදු අඩුකිරීමට පෙර දල ලාභය | **225,908,555** | **252,920,612** |
| පොලි වියදම් | 17,712,733 | 9,763,078 |
| පොලි ආදායම | (3,415,480) | -22194710 |
| ලාභාංශ | | (54,000) |
| පෙර වර්ෂයේ ගැලපුම | (15,869,110) | |
| ප්‍රතිපාදනයන්ට පෙර මෙහෙයුම් තුලින් ශුද්ධ ලාභය | 224,336,698 | 240,434,980 |
| ශුද්ධ වත්කම් (NEMO) පවරා ගැනිම) | | (152,287,728) |
| ස්ථාවර වත්කම් හී ජංගම වත්කම් හා වගකිම ශුද්ධ අගය | | 152,287,728 |
| ගැලපීම් | | |
| ක්‍ෂයවීම් | 66,472,758 | 68,224,188 |
| බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | 24,134,787 | 22,508,490 |
| උපචිත වියදම් සඳහා ප්‍රතිපාදන | 141,623,360 | (15,377,165) |
| අභාවිත තොග සහ ණයගැති සඳහා ප්‍රතිපාදන | 8,972,476 | 8,100,423 |
| පාරිතෝෂිත ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 62,754,760 | 50,980,079 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර ලාභය | **528,294,839** | **374,870,995** |
| | | |
| තොග වැඩිවීම | 21,394,983 | (142,853,521) |
| ණයගැතියන් වැඩිවීම | (2,312,885,302) | (2,090,062,775) |
| වෙළඳ ණයහිමියන් වැඩිවීම | 1,329,458,150 | 1,807,110,858 |
| පාරිතෝෂිත ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය | **(433,737,330)** | **(50,934,443)** |
| | | |
| අඩුකලා පාරිතෝෂිත ගෙවීම් | (14,360,673) | (16,652,636) |
| මෙහෙයුම් ක්‍රියවලියෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | **(448,098,003)** | **(67,587,079)** |
| | | |
| ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| ස්ථාවර වත්කම් අත්කරගැනිම | (40,521,843) | (33,776,432) |
| ස්ථාවර වත්කම් බැහැර කිරිම | 33,256,007 | |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | (40,755,892) | (1,853,499) |
| ලාභාංශ ලැබීම් (විලම්භිත බදු) | - | 54,000 |
| පොලි ලැබීම් | 4,670,607 | 19,381,500 |
| ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **(43,351,121)** | **(16,194,431)** |
| | | |
| මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| පොලි ගෙවීම් | (17,712,733) | (9,763,078) |
| කල්බදු ගෙවීම් | (7,644,858.00) | (5,904,575) |

| | | |
|---|---|---|
| ස්ථාවර තැන්පතු නිදහස් කිරීම | | 6,484,484 |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **(25,357,591)** | **(9,183,169)** |
| මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ අඩුවීම | (516,806,715) | (92,964,679) |
| ආරම්භයේ පැවති මුදල් සහ මුදල සමාන දෑ | 133,735,173 | 225,914,521 |
| අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | **(383,071,542)** | **132,949,842** |
| පහත ආකාරයට නියෝජනය කෙරේ | | |
| අතැති හා බැංකුවේ ඇති මුදල් | 66,132,650 | 122,027,650 |
| බැංකුවේ ඇති විදුලි හා යාන්ත්‍රික කාණ්ඩයේ මුදල් | 1,260,113 | 14,907,256 |
| කෙටි කාලීන ස්ථාවර තැන්පතු | 137,310,817 | 130,555,918 |
| ජංගම ගිනුම් දෝහා බැංකුව | - | 2,474,805 |
| බැංකුවේ ඉතිරිකිරීම් | 4,896,894 | 900,000 |
| මුදල් අග්‍රිම | 333,985 | |
| මුදල් අග්‍රිමය | 2,297,125 | |
| බැංකු අයිරා | (595,303,126) | (137,915,787) |
| අවසානයේ පවතින මුදල් හා මුදල් සමාන දෑ | **(383,071,542)** | **132,949,842** |

## 2012 දෙසැම්බර් 31ට අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශයට අදාල සටහන්

### 01. ආයතනික තොරතුරු

### 01.1 සාමාන්‍යය

(I) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ, 1962 ජනවාරි 01 වන දින ස්ථාපනය කරන ලදි. ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, සිවිල් ඉංජිනේරු, ඉදිකිරීම්, කාර්මික හා විදුලි ඉංජිනේරු සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් නිර්මාණ හා ඉංජිනේරු උපදේශක සේවා, පෙර සැකසූ කොන්ක්‍රීට් උපාංග හා ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාදීමේ සේවා සපයයි.

(II) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, අංක 130 දරණ ස්ථානයේ පිහිටා ඇත.

## වැදගත් / ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය

**සාමාන්‍ය ප්‍රතිපත්ති**

**සැකසීමේ පදනම** : ඓතිහාසික පිරිවැය පදනමක් මත සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නම රුපියලට ගනනය කර ඉදිරිපත් කර ඇත.

**අනුකූලතා ප්‍රකාශනය** - විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකෘශනය සහ මුදල් ප්‍රවාහන ප්‍රකාශනය මෙන්ම ගිණුම්කරන ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශන) වලින් සමන්විත මෙම මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (සි. ඒ. ශ්‍රී ලංකා) නිකුත් කරන ලද (SLFRS / LKAAS) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතින්ට අනුකූලව සකස් කර ඇත.
ක්‍රියාකාරී වෙළඳපොලෙහි අලෙවි නොකෙරෙන මූල්‍ය පත්‍රක සඳහා සාධාරණ අගය නිශ්චය කිරීම වඩාත් සුදුසු අගය කිරීමේ ක්‍රමවේදයන් භාවිතාව මඟින් නිශ්චය කෙරේ. මෑතක සිදුකල වෙළඳපොල ගනුදෙනු ඒ හා සමාන වෙනත් පත්‍රකයක පවතින සාධාරණ අගය, වට්ටම් මුදල ප්‍රවහයන් හෝ වෙනත් තක්සේරු මාදිලි වැනි දෙය එකී ක්‍රමවේදයන් තුල අඩංගු විය හැක. 2011 දෙසැම්බර් 31 න් වූ වසර තුල මෙන්ම එතෙක් සෑම වර්ෂයකම සංස්ථාව මූල්‍ය වාර්ථාව සකස් කලේ 2011 දෙසැම්බර් 31 තෙක් බල පැවැත්වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයට අනුකූලවය. 2012 දෙසැම්බර් 31 කාලසීමාවට සකස් කෙරුන මෙම මූල්‍ය වාර්ථාව 2011 ජනවාරි 1 වන දින පටන් බලාත්මක වූ ශ්‍රී ලංකා ගිණුම්කරන (SLFRS / LKAS) සම්මතයන් ජාත්‍යන්තර ගිණුම්කරන සම්මත මණ්ඩලය (IASB) නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්ථා කරන සම්මතයන් සමඟ බොහෝසෙයින්ම එක්තැන් වී ඇත. මීට පෙර වාර්ථා කල සංස්ථාවේ මූල්‍ය ඉටුකිරීම්, මූල්‍ය තත්වයන් සහ මුදල් ප්‍රවාහනයන්ට අදාලවී`බ්‍යකීරබණී වෙත සංක්‍රාන්තියේ බලපෑම් මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ සටහන් අංක 16 හී සඳහන් වේ.

### <u>ගිණුම්කරන ප්‍රතිපත්ති</u>

**ගිණුම්කරන ප්‍රතිපත්ති වෙනස්වීම්**
වෙනත් ආකාරයක් පෙන්නුම් කර නොමැතිනම් SLFRS/LKAS වෙත සංක්‍රමණය වීමේ අරමුණ උදෙසා මෙම මූල්‍ය ප්‍රකාශයන් අඩංගු සියලු මූල්‍ය කාලසීමාවන් සහ 2011 ජනවාරි 01 දිනට මූල්‍ය තත්වය පිළිබඳ SLFRS/LKAS ආරම්භක ප්‍රකාශනයන් සඳහා යෝග්‍ය පරිදි ගිණුම්කරන ප්‍රතිපත්ති වෙනස්වීම උපයෝගී කර ගෙන ඇත.

සංස්ථාවේ මූල්‍ය තත්වයට ගනුදෙනුවෙන් ඇතිවන බලපෑම, වෙනත් ප්‍රතිඵල හෝ කොන්දේසි පිළිබඳ වඩාත් විශ්වාසනීය හා අදාල වන තොරතුරු ලබාදීම උදෙසා දේපල, යන්ත්‍ර හා උපකරණ පිළිබඳව පසුව ඇගයීමේ ගිණුම් ප්‍රතිපත්තිය පිරිවැය සිට ප්‍රතිඅගැයුම ලෙසට වෙනස් කර ඇත.

**<u>සංසන්දන තොරතුරු</u>**
පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය අදාල ස්ථානයන්හී සංසෝදනය කිරීම තුලින් වඩාත් සුදුසු ඉදිරිපත් කිරීමක් හා පවතින වර්ෂය හා වඩාත් ගැලපීම අපේක්ෂා කෙරේ.

**<u>වාර්ථා කරන කාලය අවසන් වූ පසු ඇතිවන සිදුවීම්</u>**
වාර්ථා කරන කාලය අවසන් වූ පසු සිදුවන වැදගත් සිදුවීම් සැලකිල්ලට ගනිමින් අවශ්‍යය විටදී මෙම මූල්‍ය ප්‍රකාශයේ වෙනස් කිරීම සිදුකර ඇත.

**<u>වැදගත් ගිණුම්කරන විනිශ්චයයන්, තක්සේරු හා උපකල්පනයන්</u>**
සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී, වාර්ථා කරන කාලය අවසානයේදී ආදායම් ප්‍රමාණය, වියදම්, වත්කම්, වගකීම් සහ

අවිනිශ්චිත වගකීම් අනාවරණය කිරීම ආදියට බලපෑම් ඇතිකරන විනිශ්චයන්, තක්සේරු සහ උපකල්පනයන්, පරිපාලනය විසින් සැලකිල්ලට ගතයුතු වේ. සංස්ථාවේ ගිණුම්කරන ප්‍රතිපත්ති උපයෝගි කරගැනිමේදී, අනාගතයට අදාලව වාර්ථා දිනට තක්සේරු ප්‍රභවයන් සහ මුදල් වර්ෂය තුල ඉදිරියට ගෙනයන වත්කම් හා බැරකම් කෙරෙහි සැලකිය යුතු අවදානමක් ඇතිකරන අදාල විනිශ්චයන් පිළිබඳව පහත සාකච්ඡා කෙරේ.

**විනිශ්චයන්**

සමාගමේ ගිණුම් කරන ප්‍රතිපත්ති උපයෝගි කරගැනිමේදී මුල්‍ය ප්‍රකාශනයේ හඳුනාගත් මුදල් ප්‍රමාණයන්ට සැලකිය යුතු බලපෑම් ඇති කරන තක්සේරුවන්ට යටත්වන දෙයට අමතරව පරිපාලනය මඟින් පහත දැක්වෙන විනිශ්චයන් ගෙන ඇත.

**තක්සේරු සහ උපකල්පනයන්**

ඉදිරියට ගෙන යන වත්කම් ප්‍රමාණය සහ අධීනතාවන්ට සැලකිය යුතු වෙනස්කම් ඇතිකිරීමේ අවදානමක් ඉදිරි මුදල් වර්ෂය තුල්දී ඇතිවිය හැකි, ශේෂ පත්‍ර දිනට ඉදිරිය සම්බන්ධ ප්‍රධාන උපකල්පනයන් හා වෙනත් ප්‍රධාන අස්ථිර තක්සේරු පිළිබඳ පහත විස්තර කෙරේ. මුල්‍ය ප්‍රකාශනයේ වත්කම් අදාල සටහන් තුල අනුපිළිවෙලින් ඉදිරියට ගෙනයන වත්කම් ප්‍රමාණයන් සහ අධීනතාවයන් සඳහන් වේ.

**මූල්‍ය පත්‍රක සාධාරණ අගය**

සෑම වර්ථා කරන දිනකම ක්‍රියාකාරි වෙළඳපොලෙහි අලෙවි කෙරෙන මූල්‍ය පත්‍රක සාධාරණ අගය නිශ්චය කිරීම, දක්වන වෙළඳපොල මිල හෝ අලෙවිකරුවන් දක්වන මිල ගණන් අනුව නිර්දේශ කෙරේ. දිර්ඝ තත්වයන් සඳහා ලංසු මිලද කෙටි තත්වයන් සඳහා ඉල්ලුම් මිලද සැලකෙන අතර ගණුදෙනු වියදම් සඳහා අඩු කිරීමක් නොකෙරේ.

**නිශ්චිත අර්ථලාභ සැලැස්ම - පාරිතෝශිත**

අගය කිරීමේ සූත්‍ර ක්‍රමවේදයක් භාවිතා කර නිශ්චිත අර්ථලාභ සැලැස්ම - පාරිතෝශිත වියදම නිශ්චය කෙරේ. මෙම සූත්‍ර අගය කිරීම තුල වට්ටම් ප්‍රතිශත පිළිබඳ උපකල්පනයන් කිරීම, අනාගත වැටුප් වැඩිවීම්, විශ්‍රාම දිනය ආදිය අඩංගු වේ. මෙම සැලසුම්වල අඩංගු දිර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් එම තක්සේරු සැලකිය යුතු අනියතතාවයන්ට භාජනය වේ.

**නිශ්චිත සහදත්ත / දායකත්ව සැලැස්ම සේ. අ. අ. සහ සේ. භා. අ.**

සේවා අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාරත්ව අරමුදල අදාල වන ව්‍යවස්ථාවන් හා රේගුලාසින්ට අනුකූලව සේ-වකයන් හට සේවා අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය ලැබිමට සුදුසුකම් ලබයි. සේවා අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාරත්ව අරමුදල ට සංස්ථාව විසින් සේවකයන්ගේ දල වෙතනයෙන් නියත ප්‍රතිශතයක් දායකත්වය ලබාදේ.

**තොග**

වටිනාකමින් අඩුම සහ ලබාගත හැකි අගය අනුව තොග ගනනය කෙරේ. තක්සේරු විකුණුම් මිලෙන් සම්පූර්ණ කිරිමේ වියදම සහ අලෙවිය කිරිම සඳහා තක්සේරු වියදම අඩු කල විට ලැබෙන්නේ සුද්ධ ලබාගත හැකි අගයයි. තොග දැනට පවතින ස්ථානයට හා තත්වයට ගෙන ඒමට දරන වියදම් පහත දැක්වෙන ආකාරයට ගිණුම්ගත කෙරේ.

අ) **අමු ද්‍රව්‍යය** - සත්‍ය මිලට පලමු ලැබීම්, පලමු නිකුතුව (FIFO) පදනමට

ආ) **නිමි භාණ්ඩ සහ නොනිමි ප්‍රාග්ධනය** - සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම හා ස්ථිර නිෂ්පාදන හා පවත්වාගෙන යාමේ වියදමින් අනුයෝජිත ප්‍රමාණයක්

ඇ) **වෙනත් තොග** - සත්‍ය මිල

### 01.2.7 මුදල් සහ මුදල් සමාන

මුල්‍ය ස්ථාවර ප්‍රකාශයේ සඳහන් මුදල් සහ කෙටි කාලීන තැන්පතු ලෙස අඩංගු වන්නේ බැංකුවේ සහ අත ඇති මුදල් සහ තුන් මසක් හෝ ඊට අඩු කාලයක කල්පිරීම සහිත කෙටිකාලීන තැන්පතු අඩංගු වේ. මුදල් ප්‍රවාහන ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන දෙය ලෙසට අඩංගු වන්නේ මුදල්, ඉහත දැක්වූ ආකාරයේ කෙටි කාලීන තැන්පතු සහ නොගෙවූ බැංකු අයිරා

### 01.2.8 වෙන්කිරීම් සම්භාව්‍ය වත්කම් සහ සම්භාව්‍ය වගකීම්

අතීත සිදුවීමක ප්‍රතිපලයක් ලෙසට (නීතිමය හෝ ප්‍රයෝජනවත්) සංස්ථාවට වර්ථමානයේ යම් වගකීමක් ඇති විටදී ප්‍රතිපාදන හඳුනාගැනේ. මෙම වගකීම සමතයකට පත් කිරීමට ආර්ථික ප්‍රතිලාභ එක් කරන සම්පත් පිටතට ගලායාමක් අවශ්‍යය වියහැකි වන අතර එම වගකීමේ අගය පිළිබඳව විශ්වසනීය ඇස්තමේන්තුවක් සැකසිය හැක. එම ප්‍රතිපාදන යම් ප්‍රමාණයක් හෝ සම්පූර්ණයෙන්ම උපදානය වීමක් සංස්ථාව අපේක්ෂා කරයි නම් උදාහරණයක් වශයෙන් රක්ෂණ ගිවිසුමක් යටතේ නම් එම උපදානය ස්ථිර වූ විට පමණක් එය වෙනම වත්කමක් ලෙසට හඳුනාගැනේ. යම් ප්‍රතිපාදනයකට අදාල වියදම් උපදානයක දල ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කෙරේ. මුදල් කාලීන අගය වැදගත් වේනම් සුදුසු පරිදි අධීනතාවයට නියත අවදානම පවතින පෙර බදු ප්‍රතිශතයකට ප්‍රතිපාදන වට්ටම් කෙරේ. වට්ටම් භාවිත කෙරේනම් කාලය අනුව ප්‍රතිපාදනයන් ඉහල යාම මූල්‍ය වියදමක් ලෙසට සැලකේ. සම්පත් පිටතට ගලා යාම විදුර ප්‍රකාශනයේ සටහනක් ලෙසට දැක්වේ. ව්‍යාපාර හවුලකදී පිලිගැනෙන සම්භව්‍ය අධීනතාවයක් මූලික වශයෙන් එහි සාධාරණ අගයට නිර්දේශ වේ.

## 01.2.2.9 දේපල, යන්ත්‍ර හා උපකරණ,

### හඳුනා ගැනිමේ පදනම

අනාගතයේදී වත්කමෙන් යම් ආර්ථික වාසියක් සංස්ථාවට ලැබේනම් සහ එම දේපලෙහි වටිනාකම විශ්වාසයෙන් නිර්දේශ කල හැකිනම් දේපල, යන්ත්‍ර හා උපකරණ හඳුනාගැනේ.

### නිර්දේශක පදනම

සංචිත ක්ෂයවීම සහ යම් සංචිත අපචය වීම්, පාඩු, අඩුකල වියදමක් ලෙසට යන්ත්‍ර හා උපකරණ සඳහන් කෙරේ. පිලිගැනිමේ උපමානයන් ඉටුවේ නම්, යන්ත්‍රයේ උපාංග අනුයෝග කිරිමේ ගාස්තු සහ දිර්ඝකාලීන ඉදිකිරිම් ව්‍යාපෘති සඳහා ණය, ණය ගැනිමේ වියදම් ද එවන් පිරිවැය තුල ඇතුලත් වේ. කාල සීමාවන තුල යන්ත්‍ර හා උපකරණ වල වැදගත් කොටස් අනුයෝග කිරිම අවශ්‍යය වු විටදී සංස්ථාව මඟින් එම නව උපාංගය එහි පලදායි කාලය සහ ක්ෂය විම, සමඟ පිලිගන්නා අතර ඉවත් කරන කොටස පිලිනොගැනිමට ලක් කෙරේ. එලෙසටම ප්‍රධාන පරික්ෂණයක් සිදුකිරිමේදී, පිලිගැනිමේ උපමානයන් ඉටුවේනම් එහි පිරිවැය යන්ත්‍ර හා උපකරණ සඳහා ඉදිරියට ගෙනයන අගය තුල අනුයෝග කිරිමක් ලෙසට පිලිගැනේ. අනිකුත් අලුත්වැඩියා හා නඩත්තු වියදම් ආදායම් ප්‍රකාශයේ දරණ ලද වියදම් ලෙසට පිලිගැනේ. ප්‍රති අගැයිම් දිනට තදනන්තර අපචයවීම් අයකිරිම් සහ ගොඩනැගිල්ලේ සංචිත ක්ෂයවීම් අඩුකල සාධාරණ අගය මත ඉඩම් හා ගොඩනැගිලි නිර්දේශ කෙරේ. ගෙනයන අගය අයකරවා ගත නොහැකියයි සිදුවීම් හෝ පරිවේශණ වෙනස්වීම් මත පෙන්නුම් කරයි. නම්, යන්ත්‍ර හා උපකරණ පුණරික්ෂණයට ලක්කෙරේ. ඉඩම් හා ගොඩනැගිලි තදන්තරව ප්‍රති අගැයිමේදී, එලෙසට ප්‍රති අගැයිම් කරන දිනම එවන් වත්කම් සියල්ල සාධාරණ මිලට ප්‍රතිඅගැයිමට ලක්කෙරේ.

ඕනෑම පිලිඇගයුම් අතිරික්කයෙක් වෙනත් සවිස්තර ආදායම් තුල පිලිගැනෙන අතර, වත්කම් පිලිඅගැයිම් සංචිතයේ සාධාරණතාව වේ. කෙසේ වුවද එයින් එම වත්කමට ආදායම් ප්‍රකාශයේ පිලිගැනිමට ලක්වු පිලිඅගැයිම් අගය අඩුවිමක් ප්‍රතිනමනය වේ නම් එවන් අවස්ථාවකදී එම වැඩිවිම ආදායම් ප්‍රකාශයේ පිලිගැනිමට ලක්වේ. වත්කම් පිලිඅගැයුම් සංචිතයේ පිලිගැනුන යම් වත්කමක් සම්බන්ධව පවතින අත්තිරික්කයක් හිලව් කරන ප්‍රමාණයක දී හැර, පිලිඅගැයුම් අඩුවක් ආදායම් ප්‍රකාශනයේ පිලිගැනිමට ලක්වේ. පිලිඅගැයුම් දිනට සංචිත ක්ෂය විම වත්කමේ ඉදිරියට ගෙන යන දල ප්‍රමාණය අහියස බැහැර කෙරෙන අතර දල ප්‍රමාණය වත්කමේ පිලිඅගැයුම් ප්‍රමාණයට නැවත ප්‍රකාශ වේ. බැහැර කිරිමෙන් අනතුරුව, එසේ අලෙවි කෙරෙන වත්කමට අදාල යම් පිලි අගැයුම් සංචිතයක් ඇත්නම් එය රඳවාගත් ඉපැයුම් වෙත පවරනු ලැබේ. ඉඩම් සහ ගොඩනැගිලි තදනන්තරව පිල අගැයිමේදී පිලිඅගැයුම් දින එම වර්ගයේ සියලුම වත්කම් සාධාරණ අගයට පිලිඅගැයිමට ලක්කෙරේ. අඩුම වශයෙන් වසර තුනකට වරක් වෘතිය තක්සේරුකරුවන් මඟින් පිලඅගැයුම් කිරිමේ ප්‍රතිපත්තිය සංස්ථාව විසින් පිලිගෙන ඇත.

**පිලිනොගැනිම** - දේපල, යන්ත්‍ර හෝ උපකරණ අයිතමයක් නොපිලිගැනිම, අනුයෝග, ඉවත්කිරිම හෝ භාවිතයෙන් තවදුරටත් ආර්ථික වාසියක් අපේක්ෂා නොකෙරේනම් පමණක් සිදුවේ. එසේ නොපිලිගැනිම තුලින් ඇතිවන ලාභය හෝ පාඩුව එම වත්කම නොපිලිගැනිමට ලක්වු වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ අඩංගු කෙරේ.

### අගය ක්ෂය වීම.

නිදහස් භුක්තිය ඇති ඉඩම් හැර, සියලු දේපල, යන්ත්‍ර සහ උපකරණ වල අගය මත ඍජු රේඛා ක්‍රමය භාවිතා කර ක්ෂය වීම ගනනය කෙරේ. ඒ අනුව එවන් වත්කම් වල තක්සේරු කල පලදායි ආර්ථික කාලසීමාව මත එම අගයන් ලියා අත්හරිනු ලැබේ.

වත්කම් වල තක්සේරු පලදායි කලාය පහත සඳහන් අයුරු වේ

| වත්කම | කාලය - අවුරුදු |
|---|---|
| ගොඩනැගිලි | 40 |
| යන්ත්‍ර හා උපකරණ | 05 |
| ලී බඩු හා සවිකිරිම් | 10 |
| රථවාහන | 05 |
| කාර්‍යාල උපකරණ | 05 |
| පරිඝණක | 05 |

සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම වත්කම් වල ශේෂය අගය හා ප්‍රයෝජනවත් භාවය පුණරිජ්ෂණය කරය යෝග්‍ය වේනම් සක්ස කෙරේ.

## 01.2.2.10 බදු ගැනිම්

ආරම්භක දිනට එකඟවීමේ අර්ථය මත පදනම්ව එහි බද්දක් අඩංගුවේද, ප්‍රතිඥානය ඉටුකිරිම යම් නිශ්චිත දෙපලක් හෝ දේපල භාවිතයක් මත පවතිද නැතිනම් එකඟවීමේ එම අයිතිවාසිකම නිශ්චිත ලෙසට ස්ථිර කර නැතිවුවද දේපල භාවිතයට අයිතියක් හිමිකර දිම මත පවති.

SLFRS 1 ට අනුව 2011 ජනවාරි 01 දිනට පෙර ඇතිකර ගත් එකඟවීම් සඳහා ආරම්භක දිනය 2011 අප්‍රේල් 01 වන දින ලෙසට අනුහනය කෙරේ.

**මූල්‍ය බැඳුම්**

## 01.2.2.11 අස්පර්ශනීය දේපල

**හඳුනා ගැනීමේ පදනම**

යම් වත්කමක අගය විශ්වාසනීය ලෙසට මැනිය හැකිනම් අනාගතයේදී එහි ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලා ඒම විය හැකිනම් එවන් දේපලක් අස්පර්ශනීය දේපලක් ලෙසට හඳුනා ගැනේ.

**නිර්දේශ පදනම**

පිරිවැය මත මූලික හඳුනාගැනීම අනුව වෙන්වෙන් වශයෙන් අත්පත් කරගත් අස්පර්ශනීය දේපල මැනීම සිදුකෙරේ. යම් සංචිත කාලික ණය නිදහස් කිරීමක් සහ යම් සංචිත අපචය අලාභ ප්‍රමාණයක් ඇත්නම් එම අගයන් අඩුකල පිරිවැය අගයට අස්පර්ශනීය වත්කම් ඉදිරියට ගෙනයනු ලැබේ. ප්‍රාග්ධනික සංවර්ධන වියදම් හර කල අභ්‍යන්තරයෙන් උත්පාදනය කල අස්පර්ශනීය වත්කම් ප්‍රාග්ධනික නොකරන අතර එම වියදම දරන ලද වර්ෂයේ ආදායම් ප්‍රකාශයට වියදමක් ලෙසට ඇතුලත් කෙරේ.

**පලදායි ආර්ථික ජීවයන්, කාලික ණය සහ අපචයවීම්**

අස්පර්ශනීය වත්කම් වල පලදායි ජීව කාලය පරිමිත හෝ අනියත ලෙසට ඇස්තමේන්තු කෙරේ. අස්පර්ශනීය වත්කමක් අපචයවීමේ තත්වයක් පෙන්නුම් කරයි නම්, එවන් අස්පර්ශනීය වත්කම අනියත ජීවකාලය සහිත නම් එහි පලදායි ආර්ථික ජීවය මත අපචය වූ ලෙසට ඇස්තමේන්තු කෙරේ.

## 01.2.2.12 විදේශ මුදල ගනුදෙනු

සංස්ථාව ක්‍රියාකිරීම ගෙනහැර දක්වන මුදල වන ශ්‍රී ලංකා රුපියල් මගින් විදේශ විනිමය ගනුදෙනු සහ ශේෂයන් මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කෙරේ. සංස්ථාව ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුල ක්‍රියාත්මක වන මුදල් වර්ගය කෘත්‍යාත්මක මුදල් ලෙසට සැලකේ. ගනුදෙනු ක්‍රියාත්මක වන කාලය තුල පවතින විනිමය අනුපාතයන්ට අනුකූලව සියලුම විදේශ විනිමය ගනුදෙනු අපවර්තනය කෙරේ. වර්ථා දිනට පවතින විනිමය අනුපාතයන්ට අනුව විදේශ මුදල් නාමනය වන මුදල් වත්කම් හා අධීනතාවන් කෘත්‍යාත්මක මුදල් ඒකාකාර පරිවර්ථනය කෙරේ. මූල්‍ය නොවන, අයිතම අයිතිහාසික පිරිවැය ලෙසට විදේශ මුදලින් නිර්දේශ කර මූලික ගනුදෙනුව කෙරෙන දිනට පවතින විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කෙරේ. මූල්‍ය නොවන වත්කම් හා අධීනතා, ඒවායේ අගය නිශ්චය කල අවස්ථාවේ පැවති විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කෙරේ. මූල්‍ය නොවන අයිතම පරිවර්තනයේදී මතුවන ලාභය හෝ පාඩුව, එම පරිවර්ථනයට තුඩුදුන් අයිතමයට අනුකූලව පිලිගැනීමට ලක්කෙරේ.

## 01.2.2.13 මූල්‍ය ලේඛන - මූල්‍ය වත්කම් වල මුල් පිලිගැනීම සහ පසුව කෙරෙන නිර්දේශන

## 01.2.2.14 මුල් පිලිගැනීම සහ නිර්දේශන

බණී 39 විෂය ප්‍රමාණයට අයත් මූල්‍ය වත්කම්, සාධාරණ අගයට, ලාභ හෝ පාඩු, ණය, හා ලැබිය යුතු, කල් පිරෙන තෙක් රඳවාගත් ආයෝජන විකිණීමට ඇති මූල්‍ය වත්කම් හෝ ගැලපෙන ආකාරයට බලාත්මක හෙජින් ගිවිසුමක් සඳහා නම් කරන ලද ව්‍යුත්පන්න ලෙසට වර්ග කෙරේ. මූලික පිලිගැනීමේදී තම වත්කම් වර්ග කිරීම සංස්ථාව මගින් නිශ්චය කෙරේ.

සාධාරණ මිලට නොවන වත්කම් නම් ලාභ හෝ පාඩු තුලින්, ඍජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැය එනම් වත්කමක් මිලදී ගැනීමට හෝ විකිණීමට සංස්ථාව ප්‍රයාපනය කරන දිනට වෙළඳපොලෙහි ස්ථාපිත රෙගුලාසි හෝ සම්මතයන්ට අනුව කාලසීමාවක් තුල වත්කම් බාරදීම අවශ්‍යය වන මූල්‍ය වත්කම් මිලදී ගැනීම් අලෙවි දිනට පිලිගැනීම සිදුවේ. මුදල් සහ කෙටිකාලීන තැන්පතු, වෙළඳ හා වෙනත් ලබාගත හැකි ණය හා වෙනත් ලබාගත හැකි මිලකල හෝ මිල නොකල මූල්‍ය පත්‍රක සහ ව්‍යුත්පන්න මූල්‍ය පත්‍රකයන් සංස්ථවේ මූල්‍ය වත්කම් තුල අඩංගු වේ.

## 01.2.2.14.2 පසුව කෙරෙන නිර්දේශ

මූල්‍ය වත්කම් පිළිබඳ පසුව කෙරෙන නිර්දේශ පහත දැක්වෙන ආකාරයට වර්ග කිරීම මත රඳා පවතී.

## 01.2.2.14.3 ලාභ හෝ පාඩු තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්

වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු තුලින් මුල් පිලිගැනුම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් තුල අඩංගු වේ. සමීප කාලය තුල විකිණීම හෝ ප්‍රතිමිලදී ගැනීමේ අරමුණු සඳහා මූල්‍ය වත්කම් අලෙවිය සඳහා රඳවා ගෙන සිටින වත්කම් ලෙසටම වර්ගීකරණය කෙරේ. ලාභ හෝ පාඩු තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම හෝ මූල්‍ය පිරිවැය තුල පිලිගැනෙන සාධාරණ අගයේ වෙනස්වීම්ගෙන් සමන්විත සාධාරණ මිලට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ කරුණු ද ඇතුලත් වේ.

පැවත එන දෙය හැර අලෙවිය සඳහා දරා සිටින මූල්‍ය වත්කම් සංස්ථාව විසින් අගය විනිශ්චය කිරීම තුලින් එය ඉදිරි කාලයේ අලෙවි කිරීමේ බලාපොරොත්තුව තවදුරටත් සුදුසුදැයි නිගමනය කෙරේ. ආක්‍රිය වෙළඳපොල තුල මෙම වත්කම් අලෙවි කිරීමට සංස්ථාවට අපහසු වීම අනුව කළමණාකාරණයේ ඉදිරි කාලය තුල අලෙවි කිරීම සැලකිය යුතු ලෙසට

වෙනස්වේ. දුර්ලබ වාතාවරණයක් තුලදී මෙම මුල්‍ය වත්කම් නැවත වර්ග කිරීමටද සංස්ථාව තෝරාගත හැක. ණය හා ලබාගත හැකි දෙය ප්‍රතිවර්ගිකරණ, අලෙවිය සඳහා සුදානම් හෝ කල් පිරෙන තෙක් රඳවා සිටිම වත්කමේ ස්වභාවය මත තිරණය වේ නම් කිරිමේදී සාධාරණ අගය විකල්පය භාවිතය මඟින් ලාභ හෝ පාඩු සාධාරණ අගයට නම් කරන ලද මුල්‍ය වත්කම්වලට මෙම අගය විනිශ්චය තුලින් බලපෑම් ඇති නොවේ.

**01.2.2.14.4 ණය සහ ලබාගතහැකි**

ක්‍රියාකාරි වෙළඳපොලක උපුටා දැක්විමක් නොමැති ස්ථිර හෝ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න මුල්‍ය වත්කම් ණය හා ලබාගතහැකි වත්කම් ලෙස සැලකේ. මූලික නිර්දේශයන්ගෙන් පසුව එවන් මුල්‍ය වත්කම් තදනන්තරව කායික ණය පිරිවැය ලෙසට නිර්දේශ කිරිම (අපචය වීම අඩුකල) ක්‍රියාත්මක පොලි අනුපාත ක්‍රමය (EIR) අනුව සිදුකෙරේ. ක්‍රියාත්මක පොලි අනුපාතයෙහි සංඝටනීය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය, සහ අත්කර ගැනිම මත වට්ටම් හෝ අධි මිල සැලකිල්ලට ගනිමින් කාලීන ණය නිදහස් කිරිමේ පිරිවැය ගනනය කෙරේ. ආදායම් ප්‍රකාශයේ මුල්‍ය ආදායම් තුල ක්‍රියාත්මක පොලි අනුපාත (EIR) සංඝටනිය ද ඇතුලත් වේ. ආදායම් ප්‍රකාශයේ මුල්‍ය පිරිවැය හි අපචයවීම් තුලින් ඇතිවන පාඩු පිලිගැනිම සිදුවේ.

**01.2.2.14.5 පරිනතිය තෙක් දරා සිටින ආයෝජන**

පරිනතිය තෙක් දරා සිටිමේ ධනාත්මක අපේක්ෂාව සහ හැකියාව සංස්ථාව සතුවේ නම්, ස්ථිර හෝ නිශ්චයනීය ගෙවීම් සහ ස්ථිර පරිනතියන් සහිත ව්‍යුත්පන්න නොවන මුල්‍ය වත්කම් පරිනතිය තෙක් දරා සිටින වත්කම් ලෙසට වර්ග කෙරේ. මූලික නිර්දේශයෙන් පසුව පරිනතිය තෙක් දරා සිටින ආයෝජන, අපචයවීම අඩුකල ක්‍රියාත්මක පොලී ක්‍රමයට කාලීන ණය නිදහස් කිරිම අනුව නිර්දේශ කෙරේ.

ආදායම් ප්‍රකාශයේ මුල්‍ය ආදායම් තුල ක්‍රියාත්මක පොලි අනුපාත (EIR) සංඝටනිය ද ඇතුලත් වේ. ආදායම් ප්‍රකාශයේ මුල්‍ය පිරිවැය හි අපචයවීම් තුලින් ඇතිවන පාඩු පිලිගැනිම සිදුවේ.

**01.2.2.14.6  අලෙවිය සඳහා ලබාගත හැකි මුල්‍ය ආයෝජන**

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **19 වෙනත් ආදායම්** | | |
| නිවාඩු නිකේතන කාමර අයකිරීම් | 480,148 | 677,330 |
| රා. ඉ. ස. නිවාස - කුලිය | 7,776,433 | 7,910,608 |
| ටෙන්ඩර් ගාස්තු | 31,375 | 3,069,287 |
| අබලි ද්‍රව්‍ය විකිණීම | 14,894,975 | 60,480 |
| කළමණාකරන ගාස්තු | - | 10,200 |
| ලාභාංශ ආදායම | - | 54,000 |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | 1,897,963 | 2,508,824 |
| කම්කරුවන් කුලියට දීම සහ යැපීම දීමනා අයකිරීම් | - | 222,388 |
| ශිෂත්ව ඇපකර මඟින් ආදායම | 88,630 | 1,161,556 |
| තුන්කල් දැක්ම ප්‍රදර්ශනය | - | 2,331,525 |
| ගුවන් පාලම් කුලිය | 223,726 | - |
| වෙනත් ආදායම් | 517,484 | 4,181,135 |
| | **25,910,734** | **22,187,333** |
| | | |
| **20. පරිපාලන වියදම්** | | |
| වේතන | 181,681,125 | 148,263,965 |
| සුභ සාධන | 14,693,131 | 10,567,601 |
| රක්‍ෂණය | 769,259 | 4,973,344 |
| ඉන්දන ස්නේහක/ද්‍රව්‍යය | 26,620,047 | 23,583,846 |
| අලුත්වැඩියාවන් සහ නඩත්තු | 6,480,476 | 5,525,211 |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | 1,148,984 | 1,100,052 |
| විදේශ ගමන් | | - |
| ප්‍රවාහන සහ කුලි අයකිරීම් | 26,647,087 | 19,545,115 |
| උපකොන්ත්‍රාත් ශ්‍රමය | 733,764 | 1,545,095 |
| ද්‍රව්‍යය | 22,438,332 | - |
| පාරිතෝෂිත මුදල් | 20,482,648 | (94,802,372) |
| වෘත්තීය ගාස්තු | 3,425,710 | 2,673,558 |
| බැංකු ගාස්තු සහ කොමිස් | 3,245,131 | 1,289,865 |
| සේවාවන් | - | 6,223,579 |
| මුද්‍රණ කටයුතු හා ලිපි ද්‍රව්‍යය | 12,177,483 | 7,812,964 |
| අයකිරීම් සහ බදු | 1,961,019 | 1,994,989 |
| ප්‍රචාරක කටයුතු | 21,119,007 | 15,411,639 |
| විදුලිය ජලය සහ දුරකථන | 9,295,267 | 8,322,544 |
| ක්‍ෂයවීම් | 18,106,528 | 9,271,201.00 |
| බොල් ණය | 24,134,787 | 22,508,490 |
| සෙමින් චලනය වන තොග සඳහා ප්‍රතිපාදන | 8,927,476 | 8,100,423 |
| පර්යේෂණ සහ සංවර්ධන වියදම් | 2,364,438 | - |
| දේශිය උපදේශන ගාස්තු | - | 552,142 |
| විගණක ගාස්තු | - | 550,000 |
| හර බදු | - | 1,332,793 |

| | | |
|---|---|---|
| | (119,290) | - |
| පුහුණු කිරීමේ ගාස්තු සහ දායක මුදල් | 2,357,896 | 1,284,613 |
| පුවත්පත් | 88,267 | 36,856 |
| තැපැල් හා මුද්දර ගාස්තු | 451,734 | 431,023 |
| ව්‍යාපාර ප්‍රචාර කටයුතු | 17,360,434 | 3,587,141 |
| වෙනත් වියදම් | 1,408,163 | - |
| ඉදිකිරීම් කර්මාන්ත බද්ධ | 1,221,278 | - |
| ක්‍රීඩා හා විනෝදායනය | 364,308 | - |
| නෛතික ගාස්තු | 3,540,815 | - |
| පරිත්‍යාග | 3,928,800 | 2,245,377 |
| | **439,624,663** | **213,931,054** |
| **21 පොලි වියදම්** | | |
| අයිරා පොලිය | 12,751,184 | 2,449,230 |
| ණය පොලිය | 3,067,273 | 4,008,219 |
| කල්බදු මත පොලිය | 1,894,276 | 3,305,629 |
| | **17,712,733** | **9,763,078** |
| **22 පොලි ආදායම** | | |
| ස්ථාවර තැන්පතු පොලිය | 2,443,385 | 16,893,034 |
| ඉතිරිකිරීමේ පොලිය | - | 55,881 |
| ආපදා ණය පොලිය | 91,533 | 439,959 |
| REPO පොලිය | 880,562 | 4,805,836 |
| | **3,415,480** | **22,194,710** |

# Notes

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } ඊඑච්/ඩී/එස්ඊසී/ එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 අගෝස්තු 20 දින

සභාපති,
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති.

පිටපත් :- 1. ලේකම්,ඉදිකිරීම්, ඉංජිනේරු සේවා ,නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය

2. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

RECEIVED 22 AUG 2014

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94 11 2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } ඊඑච්/ඩී/එස්ඕසී/ ඊඑල්ඩී/2012

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 අගෝස්තු 4 දින

සභාපති,

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(අ ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපතිවරයා වෙත 2014 මැයි 06 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ. මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2:1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2:2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2:2:1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව සමාලෝචිත වර්ෂයට අදාල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව පෙර වර්ෂ වලට අදාල ගැලපීම් රු. 38,609,803 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 15,869,110 ලෙස දැක්වීම.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව තොගයේ වැඩිවීම රු. 59,217,285 ක් වුවද කාරක ප්‍රාග්ධන වෙනස්වීම තුළ එය රු. 21,394,983 ලෙස දැක්වීම .

(ඇ) අනිවාර්ය පාර්ශව සඳහා ගෙවීම් වෙනුවෙන් වෙන්කිරීම්, අර්ථසාධක අරමුදල් ගෙවීම් සඳහා වෙන්කිරීම් සහ මරණාධාර සඳහා වෙන්කිරීම් ඍණ අගයන් ලෙස මූල්‍ය ප්‍රකාශනය තුල පෙන්නුම් කරන ලද වටිනාකම වූ රු. 21,782,052 නිවැරදි කිරීමකින් තොරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපීම

## 2:2:2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් කරණ ප්‍රතිපත්ති අංක 1.2.2.6 ප්‍රකාරව තොග ආගණනය කිරීමේදී පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකමෙන් අඩු අගයට තොග ආගණනය කර ඇති බව හෙළිදරව් කළද, සංස්ථාව විසින් රු. මිලියන 273.45 ක් වටිනා නිමි ද්‍රව්‍ය තොග සම්බන්ධයෙන් ශුද්ධ උපලබ්ධි අගය ගණනය කර පිරිවැය සමඟ සසඳා නොතිබුණි.

(ආ) ගිණුම් සටහන් අංක 1.2:2.14.8 අනුව වෙළඳ සහ අනෙකුත් ණයගැතියන් වෙන් වෙන්ව හඳුනාගෙන අපහායන ප්‍රතිපත්තිය (impairment) ක්‍රියාත්මක කරන බව දැක්වුවද, සංස්ථාව විසින් ණයගැතියන් වෙන් වෙන්ව හඳුනා නොගෙන ණයගැතියන් 18 දෙනෙකුට අදාලව පමණක් රු. 24,134,787 ක බොල්ණය වෙන්කිරීමක් සිදුකර තිබුණි.

## 2:2:3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත් කළ ණයගැති පාලන ගිණුම්වල රු. 5,866,794,458 ක ණයගැති ශේෂය තුළ රු. 129,533,365 ක් වටිනා අසාමාන්‍ය බැර ශේෂයක් විය.

(ආ) මිලදී ගැනීම් අග්‍රිම ගිණුම, විශේෂ මුදල් අත්තිකාරම් ගිණුම, උපකොන්ත්‍රාත් වැඩ ආරම්භ කිරීමේදී අත්තිකාරම් ගිණුම සහ ශ්‍රම උපකොන්ත්‍රාත් අත්තිකාරම් ගිණුම් වල එකතුව රු. 17,472,644 ක අසාමාන්‍ය බැර ශේෂයක් ද උපකොන්ත්‍රාත් ණයහිමි ගිණුම, වෙළඳ ණයහිමි ගිණුම සහ අනෙකුත් තැන්පතු ගිණුම් වල එකතුව රු. 566,851,864 ක අසාමාන්‍ය හර ශේෂයක්ද විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් අංශයේ කරගෙන යන ව්‍යාපෘති 9 ක එකතුව රු. 22,182,118 ක මෙහෙයුම් ලාභය රු. 48,957,553 ක් ලෙස දැක්වීම නිසා සංස්ථාවේ මුළු ලාභය රු. 26,775,435 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සංස්ථාවේ එක් එක් අංශයන් අතර අන්තර් දෙපාර්තමේන්තු ජංගම ගිණුම් ශේෂයන් වර්ෂය අවසානයේ එකිනෙක ගැලපිය යුතු වුවත් ඒවා නිවැරදිව සැසඳීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 55,975,382 ක අන්තර් දෙපාර්තමේන්තු ජංගම ගිණුම් බැර ශේෂයක් විය.

(ඉ) විලම්බිත බදු ගණනය කිරීමේදී රු. 278,682,273 ක් වටිනා ස්ථාවර වත්කම් වල ලියාහල අගය (Written down value) නොසලකා හැරීම හේතුවෙන් විලම්බිත බදු වත්කම් ගිණුම රු. 33,441,873 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී යන්ත්‍රෝපකරණ අංශය වෙත භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී නොතිබුණද රු.17,798,294 ක පුනරාවර්තන ප්‍රදානයක් ලැබුණු බවට සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල රු. 13,753,305 ක ශුද්ධ අලාභය රු. 4,044,989 ක ශුද්ධ ලාභයක් ලෙස පෙන්නුම් කර තිබුණි.

(උ) ආදායම් බදු වෙන්කිරීමේ ගිණුමේ රු. 69,587,112 ක ආරම්භක ශේෂය රු. 64,377,329 ක් ලෙස ගිණුම්ගත වීම නිසා එම ගිණුම රු. 5,209,783 ක් අඩුවෙන් දක්වා තිබුණි.

( ඌ) එකතුව රු. 19,461,344 ක දඩ මුදල්, සංග්‍රහ වියදම් , දේශීය පුහුණු වීම් පාඨමාලා ගාස්තු, අධ්‍යක්ෂ ගාස්තු හා දීමනා අනෙකුත් වියදම් ශීර්ෂයන්ට ඇතුලත් නොකර විකුණුම් පිරිවැයට ඇතුලත් කර තිබුණි.

## 2:2:4 නොසැසඳුනු පාලන ගිණුම්

පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් ශේෂ අදාල උපලේඛන සමග නොසැසඳුනි.

| ගිණුමේ විස්තරය | ගිණුමේ දැක්වූ ශේෂය | උපලේඛණයට අනුව ශේෂය | වෙනස වැඩිවීම/(අඩුවීම) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අමුද්‍රව්‍ය තොගය | 294,675,541 | 293,606,865 | 1,068,676 |
| ගණුදෙණුකරුවන්ට ගෙවිය යුතු ගිණුම් | 2,048,345,092 | 1,743,592,074 | 304,753,018 |
| ගණුදෙණුකරුවන්ගෙන් ලැබිය යුතු ගිණුම් | 1,585,807,328 | 1,602,198,576 | (16,392,248) |
| ගොඩනැගිලි | 78,347,707 | 104,135,339 | (25,787,632) |
| ගොඩනැගිලිවල ලියාහල අගය | 39,804,869 | 42,180,574 | (2,375,705) |

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට වූ ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනයේ ආයෝජන වල සාධාරණ අගය රු. 16,800,000 ක් වුවද, නව ගිණුම්කරණ ප්‍රමිත ප්‍රථම වරට භාවිතා කිරීමේදී මූල්‍ය ප්‍රකාශන සමග එදිනට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශයේ එය රු. 607,200 ක් ලෙස රු. 16,192,800 ක් අඩුවෙන් දක්වා තිබුණි.

## 2:2:5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 5,720,868,660 ක වෙළඳ ණයගැතියෝ ශේෂයෙන් සියයට 95 කට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතුව තිබුණි. එම මුදලින් රු. 903,648,558 ක් වර්ෂ 03 ඉක්මුත් වූ ණයගැති ශේෂ බැවින් ණය අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතියදී පසුගිය වසරට සාපේක්ෂව සියයට 23 කින් වෙළඳ ණයගැතියන් වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ ණයහිමියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබූ රු. 1,555,880,876 ක ශේෂය 2011 දෙසැම්බර් 31 දිනට පැවති රු. 1,193,502,684 ක ශේෂය සමග සැසඳීමේදී සියයට 30.36 ක වැඩි වීමකි.

(ඇ) උප කොන්ත්‍රාත් ණයහිමියන් රු. 520,353,787 ක ශේෂයෙන් හා යන්ත්‍රෝපකරණ අංශයේ ණයහිමියන් රු. 267,702,959 ක ශේෂයන්ගෙන් රු. 145,027,411 ක් වර්ෂ 05 ඉක්මවූ ණයහිමි ශේෂ පියවීම සඳහා ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඈ) සංස්ථාව විසින් 2000 වර්ෂයේ සිට නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු. 20,557,709 ක් සහ අයවිය යුතු රු. 5,356,353 ක් දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතියද, එම මුදල් ගෙවීමට හෝ අයකර ගැනීමට කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) 2007 වර්ෂයට පෙර සිට පැවත එන වෛද්‍ය නිවාඩු දීමනා වෙන්කිරීම් ගිණුමේ රු. 3,484,772 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ද ගැලපීම් නොකර පැවැතුණි.

(ඊ) 2005 වර්ෂයේ සිට ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පවතින දළදා මාළිගා පාලක ගිණුම, බුද්ධ ශාසන අමාත්‍යාංශ පාලක ගිණුම, දේශීය ආදායම් දෙපාර්තමේන්තු ගිණුම හා ගොඩනැගිලි දෙපාර්තමේන්තු ගිණුම් යන ගිණුම්වලට අදාලව ගෙවිය යුතු රු. 9,129,116 ක මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

(උ) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට 2011 වර්ෂයේ සිට ගෙවිය යුතු ලෙස ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පවතින රු. 233,099,481 ක මුදල සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කර නොතිබුණි.

(ඌ) වැඩබිම් 58 ක උපකොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් 2011 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනවල උපචිත ගෙවීම් ලෙස සඳහන් කර තිබූ රු. 9,614,881 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයටද නිරවුල් කර නොතිබුණි.

### 2.2.6 අත්තිකාරම් ගෙවීම් කටයුතු

---------------------------

සංස්ථාව විසින් විවිධ අරමුණු සඳහා විශාල වශයෙන් අත්තිකාරම් ලබාදීම නිතර සිදුකර තිබුණු අතර ලබාදෙන අත්තිකාරම් පියවා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට සැපයුම්කරුවන්ට ලබාදුන් අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 21,702,334 ක් හා පසුගිය වර්ෂයේ අවසාන දිනට ශේෂය රු. 14,666,769 ක් වීමෙන් සියයට 48 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩ ලැබීමට පෙර ඇණවුම් සම්බන්ධ වෙක්පත් නිකුත්කිරීම දිගින් දිගටම සිදුකර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඇණවුම් සම්බන්ධ චෙක්පත් අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 745,091,798 ක් වූ අතර, 2011 දෙසැම්බර් 31 දිනට මෙම ගිණුමේ ශේෂය රු. 423,598,569 ක් විය.පෙර වර්ෂයට සාපේක්ෂව චෙක්පත් අත්තිකාරම් ගිණුමේ ශේෂය සියයට 76 කින් වැඩිවී තිබුණි.

(ඇ) සංස්ථාව විසින් උපකොන්ත්‍රාත් වෙනුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ලබාදෙන මුදල් නියමිත කාල පරිච්ඡේදය තුළ නිරවුල් නොකිරීම නිසා ගිණුම්වල අත්තිකාරම් ශේෂ වර්ෂයෙන් වර්ෂයට ඉදිරියට ගෙනවිත් තිබුණි. සමාලෝචිත වර්ෂය දෙසැම්බර් 31 දිනට වූ උපකොන්ත්‍රාත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වටිනාකම රු. 242, 269,162 ක් විය. ඉම උපකොන්ත්‍රාත් කරුවන් සඳහා ලබාදී තිබුණු වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට නිරවුල් නොවූ අත්තිකාරම් ශේෂය රු. 264,371,467 ක් විය.

2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

පහත දැක්වෙන ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | මූල්‍ය ප්‍රකාශනවල වූ විෂයයන් | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු.මිලියන | |
| (අ) | තාරාගේන්පිට පෙරසරි අංගනය වෙනත් ස්ථානයකට ගෙනයෑමෙන් වූ මූලධන ලැබීම් | 22.65 | ලැබීම් ප්‍රතවය හා පැවරුම් ලේඛන ඇතුළත් ලිපිගොනු |
| (ආ) | මුදල් හා මුදල් සමාන දෑ තුළ ඇතුළත් අංක 9934 ගිණුමේ ශේෂය | 1.88 | බැංකු ප්‍රකාශන, බැංකු සැසඳුම්, ශේෂ සහතිකය කිරීම් |
| (ඇ) | ශ්‍රී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථා (කටාර්) සමාගමේ ආයෝජන ගිණුම් ශේෂය | 5.95 | බැංකු සහාර කිරීම්, පැන්පතු සහතික, ශේෂ අලුත් කිරීමේ නිවේදන, බැර උපදෙස් පත්‍ර |
| (ඈ) | සැපයුම්කරුවන්ට ලබාදුන් අත්තිකාරම් | 21.7 | උපලේඛණ,කාල විශ්ලේෂණ |
| (ඉ) | නිමි ද්‍රව්‍ය තොග | 75.09 | තොග සමීක්ෂණ ලිපිගොණු |
| (ඊ) | නිමි ද්‍රව්‍ය තොග (විකල පෙර සවි අංගන වැඩ බිම) | 122.98 | තොග අගය කිරීමේ ලේඛන |

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 756 | වටිනාකම රු. 16,358,641 ක අමු ද්‍රව්‍ය තොගය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) | 2004 අප්‍රේල් 28 දිනැති අංක බීඩී/356/303/23/එන් දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ලිපිය. | ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු මුදලින් ඉතිරි වූ ශේෂය රු. 20,278,812 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ආපසු යැවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/පීඊඑන්/2011/01 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | සංස්ථාව විසින් වාර්ෂික ප්‍රචාරණ වැඩසටහන සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ඇස්තමේන්තුගත වියදම් ඉක්මවීම සම්බන්ධයෙන්ද ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු. මිලියන 37.94 ක ප්‍රචාරණ වියදම් දරා තිබුණි. |
| (ඈ) | 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 2.14.1 ඡේදය | මිල ගණන් කැඳවීමේ ක්‍රමය අනුගමනය කර කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේදී ICTAD හි ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකුගෙන් වත් අවම වශයෙන් මිල ගණන් කැඳවිය යුතු වුවද උඩවලව දකුණ ඉවුරු පාර පාර දැමීමේ ව්‍යාපෘතියේ එකතුව රු. මිලියන 48.701 ක් වටිනා උපකොන්ත්‍රාත් 10 ක් පිරිනැමීමේදී කොන්ත්‍රාත්කරුවන් තුන්දෙනෙකුගෙන් පමණක් මිල ගණන් කැඳවා තිබුණි. |

(ii) 3.2.1 ඡේදය

සමාලෝචිත වර්ෂයේදී රු. 47,612,407 ක ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම් සම්බන්ධව කරන ලද නියැදි පරීක්ෂාවේදී, මිලදී ගැනීම්වලදී අනුගමනය කළයුතු ජාතික තරඟකාරී මිල ක්‍රමයෙන් බැහැරව එක් සැපයුම්කරුවෙකුගෙන් හෝ දෙදෙනෙකුගෙන් පමණක් මිල ගණන් ලබාගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

වර්ෂය තුළ සංස්ථාවේ මෙහෙයුම්වල ප්‍රතිඵලය බදුවලට පෙර රු. මිලියන 225.90 ක ශුද්ධ ලාභයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. මිලියන 347.77 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 121.87 ක අඩුවීමක් පෙන්නුම් කර තිබුණි. මේ සඳහා පහත සඳහන් කරුණු බලපා තිබූ බව නිරීක්ෂණය විය.

(අ) පසුගිය වර්ෂ 04 ක සංස්ථාවේ ශුද්ධ මෙහෙයුම් ලාභයට සාපේක්ෂව පරිපාලන වියදම අසාමාන්‍ය ලෙස වැඩි වී තිබුණ අතර ප්‍රතිශතයක් ලෙස සියයට 54 සිට සියයට 274 දක්වා විශාල ලෙස උච්චාවචනයට භාජනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම ශුද්ධ මෙහෙයුම් ලාභය මෙන් දෙගුණයක් වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ඉදිකිරීම්, විදුලි හා යාන්ත්‍රික සහ ඉදිකිරීම් උපාංග යන අංශවල ශුද්ධ මෙහෙයුම් ලාභ පිළිවෙලින් සියයට 68 ක් , සියයට 97 ක් සහ සියයට 31 කින් පිරිහී තිබුණි.

(ඇ) විදුලි හා යාන්ත්‍රික අංශයේ ශුද්ධ ආදායම 2011 වර්ෂය හැරුණු විට අනෙක් සියළුම වර්ෂයන්හිදී අඛණ්ඩව අඩුවී තිබුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දී ශුද්ධ ආදායම අඩුවීම සියයට 72 ක් පමණ විය.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතලේ වොලමයිට් පෙරසැර අංගනයේ මෙහෙයුම් කටයුතුවලින් ඉකුත් වර්ෂ 15 අතුරින් 2006 වර්ෂය හැරුණුවිට අනෙක් සියළු වර්ෂයන්වලදී අලාභ සහිතව පවත්වාගෙන ගොස් තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී අලාභය රු. 856,203 ක් හා සමුච්චිත අලාභය රු. මිලියන 38.4 ක් විය.

(ආ) දංකොටුව ගඩොල් හා වඩු නිෂ්පාදන අංගනය සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 2.3 ක අලාභ ලබා තිබුණු අතර පසුගිය වර්ෂ 15 ක් අතුරින් වර්ෂ 14 ක් ම පාඩු ලබා තිබුණි. එහි සමුච්චිත පාඩුව රු. මිලියන 25.75ක් විය. 2011 වර්ෂයට සාපේක්ෂව ගඩොල් බාහිර අලෙවි ආදායම රු. 3,446,645 ක සිට රු. 376,192 ක් දක්වා අඩුවී තිබුණු අතර එය සියයට 89 ක අඩුවීමකි. සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වඩු නිෂ්පාදනයක් බාහිරව අලෙවිකර නොතිබුණු අතර වැඩබිමේ මුළු වියදම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 50 කින් වැඩි වී තිබුණි.

(ඇ) ඉදිකිරීම් අංශයට අයත් රත්මලාන වැඩබිම 2011 වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී කිසිදු බාහිර අලෙවියක් සිදුකර නොතිබුණු අතර රු. 54,037,300 ක මුළු විකුණුම් අභ්‍යන්තර අලෙවි කිරීම් විය. වැඩ බිමෙහි ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 15 කින් වැඩිවුවද, විකුණුම් පිරිවැය සියයට 35 කින් වැඩි වීම මත මෙහෙයුම් ලාභය සියයට 63 කින් අඩුවී තිබුණි.

(ඈ) යාන්ත්‍රික හා විදුලි අංශයට අයත් පෑලියගොඩ වැඩ බිමෙහි පසුගිය වර්ෂයේ රු. 6,331,660 ක මෙහෙයුම් ලාභය සමාලෝචිත වර්ෂයේදී සියයට 95 කින් අඩුවී තිබුණි.

(ඉ) යාන්ත්‍රික හා විදුලි අංශයට අයත් රත්මලාන වැඩ බිමෙහි ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 39 කින් අඩු වුවද විකුණුම් පිරිවැය සියයට 19 කින් හා අනෙකුත් වියදම් සියයට 356 ක වැඩිවීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 12.4 ක අලාභයක් ලබා තිබුණි.

(ඊ) ඉදිකිරීම් උපාංග අංශයට අයත් පෑලියගොඩ පෙරසැරි වැඩ බිමේ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 78 කින් අඩුවී තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 3.3 ක අලාභයක් ලබා තිබුණි.

(උ) යන්ත්‍රෝපකරණ අංශයේ ඩිපෝ 07 ක හා වැඩබිම් 05 ක පිළිවෙලින් රු. මිලියන 11.71 ක් හා රු. මිලියන 90.59 ක් බැගින් පාඩු ලබා තිබුණු අතර ඩිපෝ 02 ක කිසිදු ආදායමක් සමාලෝචිත වර්ෂය තුළදී උපයාගෙන නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ 153 වගන්තියට අනුව සංස්ථාව විසින් බදු විධානයන් ලබා ගෙන තිබියදීත් සේවාලාභී ආයතනයන් කිසි පරිදි දැනුවත් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රඳවා ගැනීමේ බදු වශයෙන් රු. 56,728,900 ක මුදලක් සේවා ලාභී ආයතනයන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි.

(ආ) ස්ථාවර තැන්පතු පොලී ආදායමෙන් රඳවා ගැනීමේ බදු අඩු කිරීම වලක්වා ගැනීම වෙනුවෙන් විධානයක් ලබාගැනීමට සංස්ථාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට 2011 දෙසැම්බර් 16 දින ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රය සංස්ථාව නම බදු වගකීම් නිසියාකාරව නිරවුල් නොකිරීම, යන හේතුව මත ප්‍රතික්ෂේප කර තිබුණි.2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා බැංකුව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණු පොලී ආදායම් මත රඳවාගැනීම් බදු ගිණුමේ සමුච්චිත ශේෂය රු. 6,478,966 ක් බදු බැර වශයෙන් හිලව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව රු. මිලියන 9.5 ක් බදු වෙනුවෙන් 2003 වර්ෂයේ සිට ප්‍රතිපාදනය කර තිබුණු අතර එය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හඳුනාගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) එකතු කළ අගය මත බදු ගණනය කර ගෙවීමේදී රු. 29,516,563 ක යෙදවුම් බදු වට්ටමක් නොසලකා හැර ගෙවීම හේතුවෙන් රු. 20,665,484 ක එකතුකල අගය මත බදු මුදලක් 2002 සහ 2003 වර්ෂවලදී වැඩිපුර ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයටද මෙම මුදල නිරවුල් කර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ඉ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2012 නොවැම්බර් 09 දිනැති ලිපිය අනුව සංස්ථා කළමනාකරණය අතීත බදු බිල්පත් නිසියාකාරව නිරවුල් කිරීමට අපොහොසත් වීම මත හිඟ පිරිවැටුම් බදු, ආරක්ෂක බදු, ජාතික රැකගැනීමේ බදු, එකතුකල අගය මත බදු සහ ආර්ථික සේවා බදු වශයෙන් රු. 89,421,863 ක දඩ මුදලක්ද සමඟ වූ රු. 415,954,164 ක බදු බැරකමක් පැන නැගී ඇති බව දැනුම් දී තිබුණි.

(ඊ) ගෙවිය යුතු අනෙකුත් බදු බැරකම් යටතේ දක්වා ඇති වර්ෂ ගණනාවක සිට පැවත එන රු. 3,739,236 ක් පැහැර හරින ලද බදු වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයටද පැවතුණි.

(උ) සංස්ථාවේ ගිණුම් අනුව ගොඩනැගිලිවල ලියාහළ අගය (Accounting written down value) රු. 22,937,054 ක් වුවද එය රු. 2,157,698 ක සෘණ අගයක් ලෙස සලකා විලම්බිත බදු ගණනය කර තිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය, වැඩබිම් 08 ක් සහ ප්‍රාදේශීය කාර්යාල 9 ක් පවත්වාගෙන යන අක්කර 35 ක් පමණ විශාල ඉඩම් සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිත්‍යානුකූල හිමිකම් ලබාගෙන නොතිබුණි.

4.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 ජූනි 16 දින සිට 2012 ජූනි 15 දින දක්වා වූ අවුරුද්දක කාල පරිච්ඡේදයක් සඳහා පමණක් සංස්ථා සේවකයන්ට ජීවිත රක්ෂණ ආවරණ සහ වෛද්‍ය රක්ෂණ ආවරණ ලබාදීම සඳහා 2011 වර්ෂයේදී එකතුව රු. 5,885,178 ක මුදලක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවා තිබුණු නමුත් මෙම රක්ෂණ ආවරණය 2012 ජූනි 15 දිනෙන් පසුව ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී එක් ව්‍යාපෘතියක ඇස්තමේන්තුගත වියදමින් රු මිලියන 25 ක් ඉක්මවීම පිළිබඳව පුවත්පත් දැන්වීමක් පලකිරීම වෙනුවෙන් රු. 1,960,272 ක වියදම් දරා තිබුණි.

(ඇ) විදේශ රැකියාවක නිරතවීම සඳහා වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති සේවකයෙකු 2012 අගෝස්තු 15 දින සේවයට වාර්තා කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයටද ඔහු සේවයට වාර්තා කර නොතිබුණි. ඔහුගෙන් අයවීමට ඇති රු. 351,973 ක, බැඳුම්කරය ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 ආර්ථික නොවූ ගනුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී විදේශ රටවල ඉදිකිරීම් ව්‍යාපාරී ආරම්භ ආදායම් ඉපයීමට සංස්ථාව උනන්දු වී තිබුණු අතර ඒ සඳහා රු. 13,130,730 ක මුදලක් වියදම් කර තිබුණි. එහෙත් කිසිදු විදේශ රටක ඉදිකිරීමක් ඇරඹීමට, කොන්ත්‍රාත් ලබා ගැනීමට හෝ කිසිදු ආදායමක් ඉපයීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සංස්ථාව අපොහොසත් වී තිබුණු අතර දරන ලද සියළු වියදම් නිෂ්ඵලදායී වියදම් වී තිබුණි.

(ආ) ඉදිකිරීම් කොන්ත්‍රාත් නියමිත කාලය තුළ අවසන් නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැඩ ප්‍රමාද ගාස්තු ලෙස රු. 11,313,468 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීමට සංස්ථාවට සිදුවී තිබුණි.

(ඇ) සිවිල් වැඩ දීප ව්‍යාප්ත කිරීමේ අරමුණින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 49 දෙනෙක් අලුතින් ප්‍රවර්ධන නිලධාරීන් ලෙස බඳවාගෙන තිබුණු අතර ඔවුන්ට සමාලෝචිත වර්ෂය තුළදී රු. 15,305,200 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. කොළොන්නාව ද, මාතලේ, දං කොටුව වැනි ස්ථානවල පිහිටි නිෂ්පාදන ව්‍යාපෘතිවල සමාලෝචිත වර්ෂයේදී පිරිවැටුම සැලකිය යුතු මට්ටමකින් වැඩිවීමක් නොමැතිව දිගින් දිගටම අලාභ ලබන තත්ත්වයේම පැවති අතර එම ව්‍යාපාරික කිහිපයක් ආර්ථික නොවන වර්ෂය තුළ ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් ලෙස රු. 47,361,550 ක් දරා තිබුණි.

4.6 හඳුනා ගන්නා ලද පාඩු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් නිසි කළමනාකරණ පරිචයන් අනුගමනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට සංස්ථාවේ කොන්ත්‍රාත් ව්‍යාපෘති 28 ක් සඳහා රු. මිලියන 215.98 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) ටෙන්ඩර් වටිනාකම රු. මිලියන 1,444 ක් වූ ඛෙත්තාරාම ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ, සළ වැඩ වටිනාකම රු. මිලියන 1,408 ක් සඳහා ලැබිය යුතු වැට් බදු මුදල වූ රු. මිලියන 168.99 ක සම්පූර්ණ බදු මුදල ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් සංස්ථාවට ලැබී නොතිබුණි. එයට හේතු වශයෙන් ක්‍රිකට් ආයතනයට වැට් බදු සහන ලැබෙන බව දක්වා තිබුණි. එහෙත් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක එෆ්පී 06/20/03/03/19 (SP- Vol ii ) දරන ලිපියට අනුව 2011 පෙබරවාරි 01 දින සිට 2011 මැයි 01 දින දක්වා වූ මාස තුන ඇතුළත සිදුකරන කාර්යයන් සඳහා පමණක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු සහන ලැබී තිබුණු බැවින් ඊට පෙර සිදුකළ ඉහත කාර්යයන් සඳහා බදු සහන ලැබී නොමැති බව පැහැදිලි වේ. මෙම ව්‍යාපෘතියට අදාලව කල වැඩ සඳහා වැට් රහිතව තවදුරටත් රු. මිලියන 321.5 ක මුදලක් 2014 මාර්තු 31 දින වන විටත් සංස්ථාවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ලැබිය යුතුව තිබුණි.

## 4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් කොන්ත්‍රාත් 18 ක් සඳහා ටෙන්ඩර් වටිනාකම ඉක්මවා වියදම් කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 180.67 ක පාඩුවක් සංස්ථාවට සිදුවී තිබුණි.

(ආ) රු. මිලියන 133.74 ක සමුච්චිත වියදමක් කර තිබූ ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති 22 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉන්වොයිස් ඉදිරිපත් කර සේවායෝජකයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 දෙසැම්බර් 31 දින වන විට රු. 919,860,187 ක සමුච්චිත පිරිවැයක් දරා තිබුණු ව්‍යාපෘති 34 ක් 2011 සහ 2012 වර්ෂවලදී අක්‍රියව පැවතුණි.

(ඈ) සංස්ථාව විසින් භාරගන්නා සමහර ඉදිකිරීම් කටයුතු වල උපදේශන කටයුතු සංස්ථාවේ උපදේශන අංශය විසින් ඉටුකරනු ලබයි. සළ වැඩ සඳහා ඉදිකිරීම් අංශය පිළියෙල කරන බිල්පත් උපදේශක අංශය විසින් දින 21 ඇතුළත සහතික කළයුතු වුවද, රු. 197,362,608 ක් වටිනා ව්‍යාපෘති 23 ක බිල් ඉදිරිපත් කළද සහතික කිරීම මාස 02 සිට වර්ෂ 02 ක් දක්වා කාල පරාසයකින් ප්‍රමාදවීම සේවායෝජක වෙතින් මුදල් ලබා ගැනීමේ ප්‍රමාදයට සෘජුව බලපා තිබුණි.

**4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්**

---

පහත සඳහන් නිරීක්ෂණයෙන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයේ විධානයන්ට පටහැනිව 2012 වර්ෂයේ මුල් මාස 6 තුළ පමණක් සංස්ථාව විසින් වාහන 25 ක් ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශයට මුදාහැර තිබුණු අතර මෙම වාහන සඳහා ඉන්ධන වියදම් සහ කුලී ගාස්තු ලෙස රු. 9,910,467 ක වියදම් දරා තිබුණි. සංස්ථාවට අයත් වාහන අමාත්‍යාංශයට මුදාහැරීම සම්බන්ධයෙන් තොරතුරු කැඳවූවද එකී තොරතුරු 2014 මාර්තු 31 දින වනතෙක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ ලේකම්වරුන් දෙදෙනෙකුට වර්ෂය තුළ රු. 1,200,000 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

**4.9 සංස්ථාවේ අරමුණු වලින් පරිබාහිර වියදම් දැරීම**

ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා රු. 1,155,000 ක් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ අරමුණු වලින් පරිබාහිරව වියදම් කර තිබුණි.

**4.10 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

| සේවක විස්තරය | අනුමත සංඛ්‍යාව | 2012-12-31 දිනට | 2013-12-31 දිනට |
|---|---|---|---|
| ස්ථිර | 2623 | 2091 | 2012 |
| කොන්ත්‍රාත් | 260 | 908 | 1076 |
| අනියම් | - | 21 | 14 |
| එකතුව | 2883 | 3020 | 3102 |

පහත සඳහන් නිරීක්ෂණයෙන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා සංස්ථාවට අදාලව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යය මණ්ඩලය 2883 ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට සේවයේ නියුතු කාර්යය මණ්ඩලය 3020 ක් විය. එබැවින් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා 137 දෙනෙකු සේවයේ අනුයුක්ත කර තිබුණු අතර, 2013 දෙසැම්බර් 31 දින වන විට අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා 219 ක් සේවයේ යොදවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සංස්ථා සේවයට අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් සේවක සංඛ්‍යාව 648 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට එම සංඛ්‍යාව 816 දක්වා ඉහළ ගොස් තිබුණි.

(ඇ) 2009 නොවැම්බර් 25 දිනැති අංක පීඑම්එස්/ඊ3/43/4/265/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු ඇතිකිරීම හෝ පුරප්පාඩු පිරවීම සිදු නොකළ යුතු බවට දැනුම් දී තිබියදීත් අනුමත නොවූ තනතුරු 22 ක් ඇතිකර ඒ සඳහා සේවකයින් 106 ක් බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී රු. 45,016,764 ක් පමණ වැටුප් වශයෙන් ගෙවා තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට එසේ ඇති කළ තනතුරු සංඛ්‍යාව 32 ක් දක්වා ඉහළ ගොස් තිබුණු අතර බඳවා ගෙන තිබුණු සේවක සංඛ්‍යාව 197 ක් සඳහා ගෙවූ වැටුප් රු. 62,949,396 ක් විය.

(ඈ) 2011 පෙබරවාරි 14 දිනැති අංක පීඑම්එස්/ඊ3/43/4/265/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුව බඳවා ගත හැකි ස්ථිර නුපුහුණු සේවක සංඛ්‍යාව 500 සිට 460 දක්වා අඩුකර සංශෝධනය කර තිබුණු නමුත් 2012 දෙසැම්බර් 31 සහ 2013 දෙසැම්බර් 31 දිනයන් වන විට සේවයේ යෙදුණු සංඛ්‍යාව පිළිවෙලින් 775 ක් සහ 706 ක් විය. මෙලෙස අනුමත සංඛ්‍යාව ඉක්මවා සේවයේ යෙදුණු සේවකයන්ට ගෙවූ වැටුප් ප්‍රමාණය පිළිවෙලින් රු. 5,748,750 ක් සහ රු. 4,489,500 ක් පමණ විය.

(ඉ) 2012 දෙසැම්බර් 24 දිනැති අංක 49 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව එක් අයෙකුට රු. 10,000 ක ප්‍රසාද දීමනාවක් වශයෙන් සේවකයින් 2482 කට එකතුව රු. 6,205,000 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා තිබුණි. එමෙන්ම 2012 වර්ෂයේ මාර්තු මාසයේදී රු. 14,025,000 ක මුදලක් සේවකයින්ට දීමනා ලෙස ගෙවා තිබුණු අතර එම දීමනාවට කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි. එබැවින් චක්‍රලේඛයට පටහැනිව ගෙවන ලද මුළු ප්‍රසාද මුදල රු. 20,230,000 ක් විය.

(ඊ) සංස්ථාවේ ඉහළ කළමනාකරණය නියෝජනය වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 04 ක් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණි.

## 5 ගිණුම් කටයුතු භාවිය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් ගිණුම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දින 320 ක කාල ප්‍රමාදයකින් පසුව එනම් 2014 ජනවාරි 17 දින 2012 වර්ෂයට අදාළ අවසන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි

### 5.2 සංයුක්ත සැලැස්ම

2007 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඩී 47 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය පිළිබඳව මාර්ගෝපදේශ සංග්‍රහයේ 05 පරිච්ඡේදය පරිදි, යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මක් නියමිත පරිදි විස්තරාත්මකව සකසා මූල්‍ය වර්ෂය ආරම්භ කිරීමට දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත හා රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ ලේකම් හා පිටපතක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණු අතර 2012 - 2015 දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සකස් කර ඉදිරිපත් කර තිබුණු සංයුක්ත සැලැස්ම තුළ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1957 අංක 49 දරණ සංස්ථාවේ පනතට අදාලව පහත සඳහන් අරමුණු සංයුක්ත සැලසුම් තුළ ඇතුලත්ව නොතිබුණි.

(i) ඛනිජ තෙල් නිෂ්පාදන විකිණීම සඳහා පහසුකම්ද සහිතව වාහන සහ යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම.

(ii) කාර්මික අරමුණු සඳහා භාවිතා කරන සවර වර්ගයක උපකරණ, යන්ත්‍ර සූත්‍ර අමතර කොටස්, ආයුධ හා මෙවලම් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙනයන සවර සමාගමක් හෝ සංස්ථාවක් හෝ පුද්ගලයින් සඳහා නියෝජිත ආයතනයක් වශයෙන් කටයුතු කිරීම.

(ආ) 2007 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඩී/47 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය අනුව

(i) සංයුක්ත සැලැස්මෙහි කාර්යයන් ක්‍රියාකාර සැලැස්ම හා අයවැය ලේඛනය අතර සම්බන්ධතාවයන් ගොඩනැගෙන ආකාරය දක්වා නොතිබුණි.

(ii) ඒ ඒ වර්ෂ අවසානයට සංයුක්ත සැලැස්මේ කාර්යයන් ඉටුකිරීම් පිළිබඳ ප්‍රගතිය හා ක්‍රියාත්මක නොවුණු හා මන්දගාමී අංශ පිළිබඳ ඇගයීම් කර ඉදිරි ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයටද ලක් කර නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්මේ ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරකම් වලට අදාලව එක් එක් කාර්යභාර නිලධාරීන් ලඟා කර ගත යුතු ඉලක්කයන් සහ ක්‍රියාකාරකම් දක්වා තිබුණද, අදාල ඉලක්කයන් ප්‍රමාණාත්මක වටිනාකම් දක්වා නොතිබුණි.

(ඈ) සංයුක්ත සැලැස්මේ ඇතුළත් ලාභ අලාභ ප්‍රකාශණයේ අදාල මෙහෙයුම් ලාභයන් ලඟා කර ගන්නේ කෙසේද යන්න වර්ෂයෙන් වර්ෂයට ඒවායේ ඇති අන්තර් සම්බන්ධතාවය පැහැදිලි කර නොතිබුණි.

(ඉ) කාර්ය සාධන ඇගයීමට අදාල ප්‍රධාන මිණුම් දර්ශකයන් සංයුක්ත සැලසුමට ඇතුළත් කර නොතිබුණි.

5.3 ක්‍රියාකාර සැලැස්ම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව අනුව සංස්ථාව විසින් 2006 වර්ෂයෙන් පසුව වාර්ෂිකව සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර සැලැස්මක් සකස් කිරීමෙන් තොරව කටයුතු කිරීම නිසා ආයතනයේ අරමුණු අනුව කටයුතු මෙහෙවා නොමැති බව නිරීක්ෂණය විය.

5.4 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් විය.

(අ) වාර්ෂික විගණන වැඩ සටහනෙහි ඇතුළත් කාර්යය භාරයන් තුළ කාර්යය සාධන විගණනයට ප්‍රමාණවත් අවධානයක් යොමුව නොතිබුණු අතර කාර්යය සාධන ඇගයීම්වලට අදාල විගණන විමසුම්ද ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සංස්ථාවේ විවිධ අංශ යටතේ ක්‍රියාත්මක වන නිෂ්පාදන ව්‍යාපෘතීන්ගේ ලාභදායීත්වය සහ කාර්යය සාධනය ඇගයීම වෙතට යොමුවූ විගණන ක්‍රියාකාරකම් රැසක් විගණන වැඩ සටහනෙහි ඇතුළත් කර තිබුණද එම අංශ වර්ෂ 10 කට වැඩි කාලයක සිට අඛණ්ඩව අලාභ ලබා තිබුණි.

(ඇ) සංස්ථාව විසින් විවිධ වැඩසටහන් වෙනුවෙන් අත්තිකාරම් ලබාදීම, අත්තිකාරම් පියවීම සහ ඒ වෙනුවෙන් පවතින අභ්‍යන්තර පාලනය ප්‍රමාණවත් අධීක්ෂණයකට අදාල විගණන ක්‍රියාකාරකම් රැසක් විගණන වැඩසටහන තුළ ඇතුළත් කර තිබුණද, පසුගිය වර්ෂ ගණනාවක සිට නොපියවූ අත්තිකාරම් ශේෂය අඛණ්ඩව ඉහල ගොස් තිබුණු අතර අත්තිකාරම් කටයුතු පිළිබඳ පවතින පාලන පද්ධතියේ අඩුපාඩු රැසක්ද අනාවරණය විය.

## 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛ අංක 4.2 ප්‍රකාරව සංස්ථාව විසින් 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

## 5.6 අයවැය ලේඛනමය පාලනය

සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව තථ්‍ය ආදායම් සහ ලාභය අයවැයගත සංඛ්‍යා සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු. මිලියන 1264.70 ක හා රු. මිලියන 185.65 ක වෙනස්කම් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ලේඛනය යථාරූපී භාවයෙන් යුක්තව සකසා නොතිබුණු අතර එය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් වශයෙන්ද යොදා ගෙන නොතිබුණි.

## 5.7 වාර්ෂික වාර්තා සභාගත කිරීම

සංස්ථාව විසින් 2011 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2014 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව මුදල් පනතේ 13(7) (අ ) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලැබූ විස්තරාත්මක වාර්තාව මගින් සංස්ථාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) තොග පාලනය
(ආ) අත්තිකාරම් කටයුතු
(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
(ඈ) මූල්‍ය කළමනාකරණය
(ඉ) බදු කළමනාකරණය
(ඊ) අයවැය පාලනය හා සංයුක්ත සැලැස්ම
(උ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(ඌ) කොන්ත්‍රාත් පාලනය

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති.